ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2014

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

දැක්ම

ගංවතුරින් තොර පරිසර හිතකාමී පරිසරයක් සහ දූෂණයෙන් තොර ජලාශ ඇතිකිරීමේ සහ කළමනාකරණය කිරීමේ ප්‍රමුඛ්‍යා වීම.

මෙහෙවර

ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඉහළ කාර්යක්ෂමතාවයක් සහ අභිප්‍රේරණයක් සහිත කාර්ය මණ්ඩලයක් මඟින් වැසි ජල අපවහන, තෙත්බිම් කළමනාකරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉංජිනේරු සේවා සැපයීම.

පටුන

	පිටු අංකය
සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවුඩය	1
සංයුක්ත තොරතුරු	2
ජ්‍යෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	4
ආයතනික ව්‍යුහය	5
මෙහෙයුම් සමාලෝචනය	6
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	86
විගණකාධිපති වාර්තාව - 2014	88
ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	105
ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	106
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	107
ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය	109
සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	110
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	115
සංස්ථාවේ මූල්‍යමය විශේෂතා	131

සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවුඩය

බොහෝ හේතූන් නිසා 2014 වර්ෂය ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට (ශ්‍රීලඉගොහාසසං) තවත් එක් විශිෂ්ට වර්ෂයක් විය. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සාර්ථක සහ ලාභ උපයන ආයතන වලින් එකක් බවට පත් වීමට සංස්ථාවට හැකියාව ලැබිණි. 2014 වර්ෂය තුළදී මෙම ප්‍රගතිය අත්පත් කර ගැනීමට හැකි වූයේ ප්‍රධාන වශයෙන් අප වෙත ලැබුණු අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට හැකිවීමෙන් සහ ශ්‍රීලඉගොහාසසං කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය වෙහෙස මහන්සි වී වැඩ කිරීම හේතුවෙනි.

2013 වර්ෂයේ මුළු පිරිවැටුම (රු.මි.1025ක භාණ්ඩාගාර ප්‍රදානය ඇතුළුව) වන රු.මි. 2503 හා සැසඳීමේදී 2014 වර්ෂය තුල මුළු පිරිවැටුම (රු.මි.1608ක භාණ්ඩාගාර ප්‍රදානය ඇතුළුව) රු.මි. 3276කි. 2013 වර්ෂයේ ලාභය වන රු.මි.118 හා සැසඳීමේදී 2014 වර්ෂයේ බදු පෙර ලාභය රු.මි. 439කි. 2013 වර්ෂයේ බදු පසු ලාභය වන රු.මි.104 හා සැසඳීමේදී 2014 වර්ෂයේ බදු පසු ලාභය රු.මි. 354කි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී සංස්ථාවේ දළ ලාභය 28%කින් ඉහළ ගොස් ඇත.

2013 වර්ෂය හා සැසඳීමේදී රු.මි.936 ක් 53%ක ඉහළ යෑමක් වාර්තා කරමින් සහ විශිෂ්ට ආදායමක් උපයමින් ඉදිකිරීම් ව්‍යාපෘති එහි උපරිම කාර්ය සාධනය සාක්ෂාත් කරගෙන ඇත. කොළඹ නගරය සඳහා නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය වෙනුවෙන් වැල්ලවත්ත සාලමුල්ල සහ මයුර පෙදෙසෙහි තට්ටු ගොඩනැගිලි ඉදිකිරීම, සංස්ථාව සාර්ථකව සම්පූර්ණ කරන ලද සැලකිය යුතු ඉදිකිරීම් ව්‍යාපෘති සමහරකි.

දෙහිවල, ගල්කිස්ස, බෙල්ලන්විල සහ රත්මලාන ඇතුළු බොහෝ ප්‍රදේශවල ගංවතුර ඇතිවීම වැළැක්වීම සඳහා සංස්ථාව විසින් රු.මි.14,227ක පිරිවැයකට වේරළස් ගඟ ද්‍රෝණිය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මෙය, කිසිදු විදේශ ආයතනයක ක්‍රියාකාරී සහභාගීත්වයකින් තොරව ගංවතුර පාලන ක්ෂේත්‍රයේ සංස්ථාව භාරගත් විශාලතම ව්‍යාපෘති වලින් එකකි. මෙම ව්‍යාපෘතියේ කොටසක් වන බෙල්ලන්විල පූජා භූමියේ මහජන උපයෝගිතා වැඩිදියුණු කිරීම සංස්ථාව මේ වනවිටත් අවසන් කර ඇත.

කොළඹ නගර අලංකරණ වැඩසටහනෙහි, ඇළ මාර්ග සහ මාර්ග සංවර්ධනය වැනි බොහෝ ක්ෂේත්‍රවල සංස්ථාව ක්‍රියාකාරීව නිරත වී ඇත. සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගනිමින්, සංස්ථාව මෙහෙයුම්වල සියළු ප්‍රධාන ක්ෂේත්‍රයන්හි එහි සමස්ත ඵලදායීතාවය, කාර්යක්ෂමතාවය සහ ලාභදායීතාවය වැඩිදියුණු කරගෙන ඇත.

සංස්ථාවේ ආචාර ධර්ම රාමුවට අනුකූලව ඉංජිනේරුම විශිෂ්ටත්වය සහ සම්පත් භාවිතා කරමින් තිරසර යටිතල වියුහ සංවර්ධනය සහ පරිසර හිතකාමී පරිසර සඳහා උපායමාර්ගික සහකරු ලෙස සංස්ථාව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු ලෙසින් දායකත්වය දක්වා ඇත.

අවසන් වශයෙන්, සමාලෝචිත වර්ෂය සාර්ථකත්වයට පත් කර ගැනීම සඳහා නන් අයුරින් සහාය ලබා දුන් රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා, සභාපතිතුමා, ශ්‍රීලඉගොහාසසං අධක්ෂ මණ්ඩල සමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ ශ්‍රීලඉගොහාසසං කාර්ය මණ්ඩලය, රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ ඇති අනෙකුත් ආයතන වල නිලධාරීන්, ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, අපගේ සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් සියළු උනන්දුවක් දක්වන්නන් හට මාගේ අවංක කෘතවේදීත්වය පලකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එම් ඒ එස් එම් කේ සේනාධීර
සාමාන්‍යාධිකාරි
2015.02.27

සංයුක්ත තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලය

එල්.ඒ.පී. හර්ෂන් ද සිල්වා මයා	සභාපති ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
රොහාන් සෙනෙවිරත්න මයා	අධ්‍යක්ෂ අතිරේක ලේකම් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
නිමල් පෙරේරා මහතා	සභාපති නාගරික සංවර්ධන අධිකාරිය “සෙත්සිරිපාය” බත්තරමුල්ල
ඉංජි. හද්‍රා කමලදාස මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් - වාරිමාර්ග වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිල බලයෙන්
කේ.ඩී.ආර්.ඔල්ගා මිය	මහා භාණ්ඩාගාරයේ නියෝජිත රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය
ධම්මික අටිගල්ලේ මයා	අධ්‍යක්ෂ සමූහ අධ්‍යක්ෂ – උපාලි සමූහ ව්‍යාපාරය
කොමදෝරු එච්.එස්. බාලසූරිය මයා	අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නාවික සිවිල් ඉංජිනේරු නිලධාරි (විශේෂ ව්‍යාපෘති) ශ්‍රී ලංකා නාවික හමුදාව
සමන් ගලප්පත්ති මයා	අධ්‍යක්ෂ නීතිඥ
වී.කුරුකුලසූරිය මයා	අධ්‍යක්ෂ ජනරාල් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

සංයුක්ත තොරතුරු (ඉදිරියට.,)

සංස්ථාවේ නෛතික තත්ත්වය

කොළඹ දිස්ත්‍රික්කයේ පහත් බිම් ප්‍රදේශ ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය යනුවෙන් මීන් පෙර හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, 1968 අංක 15 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කරන ලදී. 1976 අංක 27 දරන සංශෝධන පනතින් සංස්ථාවේ පරමාර්ථ පුළුල් කරන ලදී. 1982 අංක 52 දරන සංශෝධන පනතින් මණ්ඩලයේ නම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් වෙනස් කොට එහි බලප්‍රදේශයද මුළු දිවයිනම ආවරණය වන පරිදි පුළුල් කරන ලදී. 2006 අංක 35 දරන පනතින් ඉහත කී පනත තවදුරටත් සංශෝධනය කරන ලද අතර අනවසර ගොඩකිරීම් සහ ජල මූලාශ්‍ර දූෂණය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය එමගින් සංස්ථාව වෙත පවරා ඇත.

ප්‍රධාන කාර්යාලය

3, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

විගණකවරු

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

නීති උපදේශක

නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
අළුත්කඩේ,
කොළඹ 12.

බැංකුකරුවෝ

ලංකා බැංකුව
මහජන බැංකුව


සංයුක්ත තොරතුරු (ඉදිරියට.,)

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයින්

01.	එම්.ඒ.එස්.එම්. කේ. සේනාධීර මිය	-	සාමාන්‍යාධිකාරි
02.	කේ. රාජපක්ෂ මයා	-	අතිරේක සාමාන්‍යාධිකාරි - (තාක්ෂණික)
03.	ඩබ්.එස්. ආරියසිංහ මයා	-	අතිරේක සාමාන්‍යාධිකාරි - (ක්‍රියාවට නැංවීම්)
04.	ජී.එස්.එම්. අබේසේකර මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරියත හා උපකරණ)
05.	ටී.බී.එම්. චන්ද්‍රසේකර මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන)
06.	ආර්. අයි සිල්වා මිය	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
07.	ආර්.සී. ප්‍රනාන්දු මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
08.	සී.බී. අමරසිංහ මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
09.	පී. හේමලතා මිය	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉඩම් හා අළෙවි)
10.	එස්.පී. මුතුමාල මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජලාපවහන සහ ගොඩකිරීම)
11.	වයි.පී.සී. ද සිල්වා මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්)
12.	ජේ.ඒ.පී.කේ. ජයසිංහ මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන)
13.	ඒ.එච්. තුෂාරි මිය	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
14.	එන්.එස්. විජේරත්න	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තෙත්බිම් කළමනාකරණ)
15.	එස්.ඩී. ධර්මරත්න මයා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්)
16.	ජී.ටී.ඩී.ජේ. අමරසිංහ මිය	-	ප්‍රධාන නීති නිලධාරි
17.	එල්.සී.ජී. සොයිසා මිය	-	සහකාර සාමාන්‍යාධිකාරි (තෙත්බිම් කළමනාකරණ)
18.	පී.එම්.පී. විජේරත්න මිය	-	සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
19.	කේ.අයි. කහවිට මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
20.	එස්.එන්. ගමගේ මිය	-	සහකාර සාමාන්‍යාධිකාරි (ජලාපවහනසහ ගොඩකිරීම්)
21.	ජී.ජයවර්ධන මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (යාන්ත්‍රික)
22.	ආර්.එම්.එන්.ඩී.රත්නායක	-	සහකාර සාමාන්‍යාධිකාරි
23.	ඩබ්.එච්.කීර්තිරත්න මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි
24.	ඕ.වී.ඩබ්.ආර්.ගුණතිලක මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි
25.	ඒ.බී.එන්.සහබන්දු මිය	-	සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)
26.	කේ.ඩී.අන්ද්‍රා මයා	-	සහකාර සාමාන්‍යාධිකාරි (ඉඩම් හා අළෙවි)

SRI LANKA LAND RECLAMATION & DEVELOPMENT CORPORATION

Organization Structure



ක්‍රියාකාරකම් සමාලෝචනය

ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය

භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

ගංවතුර පාලනය කිරීමේ විශේෂ ව්‍යාපෘති

ඉහළ ජන ඝනත්වයක් සහිත ප්‍රදේශයක් වන බැවින් ගුණාත්මක ජීවන තත්ත්වයක් සහ ආර්ථිකයක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ රජය කොළඹ නගරය තුළ සහ අවට වැසි ජල අපවහන පද්ධති වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත.

ශ්‍රී ලංකාවේ වාණිජ කේන්ද්‍රස්ථානය වන කොළඹ ඇතුළුව මහ කොළඹ ප්‍රදේශය සහ අවට පළාත් පාලන බලප්‍රදේශ හතරෙහි බොහෝ ප්‍රදේශ පහත් බිම් වලින් සමන්විත වන බැවින් ගංවතුර ඇති විය හැකි ප්‍රදේශ වේ.

ගංවතුර ඇතිවීමේ ප්‍රධාන හේතු ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. කෙසේවුවද සෑමවිටම ඒවා පහත එක් හේතුවකින් සමන්විත වේ:

- වැසි ජල අපවහන පද්ධතියක් නොමැති වීම
- වැසි ජල අපවහන පද්ධතිය ප්‍රමාණවත් නොවීම හෝ ප්‍රමාණවත් නඩත්තුවක් නොමැති වීම හේතුවෙන් පද්ධතිය ක්‍රමවත්ව ක්‍රියාත්මක නොවීම
- ගං පත්ල නොගැඹුරු වීම, පළලින් අඩු වීම (ස්වාභාවික ගංගා සම්බන්ධයෙන්)
- පොළවෙහි උන්නතාංශය අඩු වීම

රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මගපෙන්වීම අනුව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කොළඹ නගරය තුළ සහ අවට ගංවතුර වැළැක්වීම සඳහා මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කර ඇත. "වෝටර්ස් එජ්", රමපාලවත්ත තලවතුගොඩ මෙන්ම මහ කොළඹ ප්‍රදේශයේ ජල රැඳවුම් පහසුකම්, හැරීම් සහ අපවහන වැඩිදියුණු කිරීම් තුලින් පුළුල් කර ඇත. පවතින ඇළ මාර්ග පද්ධතිය ශුද්ධ පවිත්‍ර කිරීම, ගංවතුර රැඳවුම් ප්‍රදේශ හැරීම සහ වැඩිදියුණු කිරීම, ජල රැඳවුම් ජලාශ ඉදිකිරීම සහ පහත් බිම් අවිධිමත් ලෙස ගොඩකිරීම පාලනය කිරීම ආදිය මෙම ව්‍යාපෘතිවලට අයත් වේ.

ඉහත කාර්යයන් සඳහා 2014 වර්ෂය සඳහා මුළු භාණ්ඩාගාර වෙන් කිරීම රු.මි. 1500ක් වන අතර සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි.1512.74කි. ගංවතුර වැළැක්වීමේ විශේෂ ව්‍යාපෘති යටතේ අප සංස්ථාව විසින් පහත අපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන් සිදු කර ඇත.

1.0 බිලූමැන්ඩල්, මට්ටක්කුලිය, කාක දූපත සහ ඒ අවට ප්‍රදේශවල අපවහන වැඩිදියුණු කිරීම් සහ භූමි සැකසීමේ කාර්යයන්.

2.0 මුදුන් ඇළ, පැලියගොඩ, ඔලියමුල්ල, කැළණිය සහ කිරිබත්ගොඩ ප්‍රදේශය සහ එහි අවට ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම්,ගංවතුර පාලන සහ නාගරික භූමි සැකසුම් වැඩිදියුණු කිරීම්.

3.0 කිත්තම්පහුව ඇළ මාර්ගය, කොළොන්නාව, මීතොටමුල්ල, මුල්ලේරියාව සහ අංගොඩ ප්‍රදේශයේ සහ එහි අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ කාර්යයන් සහ භූමි සැකසුම් කාර්යයන් වැඩිදියුණු කිරීම.

4.0 බොල්ගොඩ වැව සහ අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ සහ භූමි සැකසුම් කාර්යයන්.

5.0 පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ සහ අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ, පරිසරය වැඩිදියුණු කිරීමේ සහ භූමි සැකසුම් කාර්යයන්.

6.0 හීන් ඇළ වගුරු ප්‍රදේශය, පාගොඩ ප්‍රදේශය සහ කිරුලපන-හීන් ඇළ දෙබෙදුම ඇතුළුව එහි අවට ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම් සහ නාගරික සංවර්ධන කටයුතු.

7.0 බෙරේ වැව තුළට සහ පිටතට ගලන සියළු ඇළ මාර්ග හැරීම සහ පුනරුත්ථාපනය කිරීම.

8.0 මාලිගාවත්ත,ඇපල්වත්ත ප්‍රදේශයේ සහ එහි අවට ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම.

9.0 ලුනාව ඇළ මාර්ග පද්ධතිය, ලුනාව වැව සහ එහි අවට ප්‍රදේශය හැරීම සහ පුනරුත්ථාපනය කිරීම.

10.0 වැව් සහ පොකුණු ඉදිකිරීම සහ පර්යන්ත ඇළ මාර්ග හැරීම මගින් ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම තුලින් ජල රැඳවුම් ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම.

11.0 කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ගංවතුර වැළැක්වීමේ සහ වැසි ජල අපවහන ව්‍යාපෘති.

ඉහත ව්‍යාපෘති ක්‍රියාකාරකම් පහත විස්තර කර ඇත.


1. බ්ලූමැන්ඩල්, මට්ටක්කුලිය, කාක දූපත සහ ඒ අවට ප්‍රදේශවල අපවහන වැඩිදියුණු කිරීම් සහ භූමි සැකසුම් කාර්යයන්

මෙම ප්‍රදේශවල අපවහන වැඩිදියුණු කිරීම් සහ භූමි සැකසුම් කාර්යයන් ක්‍රියාවට නැංවීම තුළින් ගංවතුර හානිය අවම කර ඇති අතර ජනතාවගේ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කර ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නංවා ඇත. මීට අමතරව කාක දූපත ප්‍රදේශය සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා ස්ථානයක් ලෙස සංවර්ධනය කර ඇත.

මෙම ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.125.00 ක් වන අතර 2014 වර්ෂය සඳහා සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම රු.මි.125.07කි.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- කාක දූපත ඇළ මාර්ගය සංවර්ධනය කිරීම
- කිඹුලා ඇළ හැරීම
- ප්‍රධාන අපවාන සම්බන්ධව වන ඇළ මාර්ග සංවර්ධනය කිරීම
- උතුරු කොළඹ ප්‍රදේශයේ ගංවතුර පාලන, පරිසරය වැඩිදියුණු කිරීමේ සහ භූමිය සැකසීමේ කාර්යයන්



ව්‍යාපෘති ප්‍රදේශයේ සිතියම



කාක දූව වැව (පෙර)



කාක දූව වැව (පසු)

2. මුදුන් ඇළ, පැලියගොඩ, ඔලියමුල්ල, කැළණිය සහ කිරිබත්ගොඩ ප්‍රදේශයේ සහ එහි අවට ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම්, ගංවතුර පාලන සහ නාගරික භූමි සැකසීම් වැඩිදියුණු කිරීම්

කැළණිය, මුදුන් ඇළ ප්‍රදේශය සහ පැලියගොඩ ප්‍රදේශය වර්ෂ ගණනාවක් තිස්සේ අධික වර්ෂා කාලවලදී ජලයෙන් යට වේ. මේ සඳහා කොළඹ සහ එහි අවට ප්‍රදේශය සීග්‍රයෙන් දියුණු වීමත් සමඟ වර්ෂ ගණනාවක් තිස්සේ සිදුවූ අවධිමත් සංවර්ධන කටයුතු ප්‍රධාන වශයෙන් හේතු විය. කොළඹ නගරයට මෙන්ම කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපල, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයට ආසන්නයේ පිහිටා තිබීම හේතුවෙන් මෙම ප්‍රදේශයට ඉහළ වාණිජ සහ කර්මාන්තමය වටිනාකමක් පවතී. එබැවින්, මෙම ප්‍රදේශයන්හි ජල අපවහනය වැඩිදියුණු කිරීම ක්‍රියාවට නැංවීමෙන් සමහර ඉඩම් විධිමත් අපවහන පද්ධතියක් සමඟින් සංවර්ධනය කල හැකි වන අතරම ගංවතුර ඇතිවීම අවම කල හැකි වේ.

මෙම කාර්ය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 150.00 ක් වන අතර 2014 වර්ෂයේදී සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 150.12 කි.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය සහ එහි අවට ප්‍රදේශය ඔස්සේ පවතින ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම
- පැලියගොඩ ප්‍රදේශයේ සහ එහි අවට ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම
- හේනමුල්ල ප්‍රදේශයේ ඇළ මාර්ග සංවර්ධනය කිරීම
- මුදුන් ඇළ හැරීම
- හෙයියන්තුඩුව දකුණ වැව සහ ඇළ මාර්ගය හැරීම
- වෙදමුල්ල වැව සහ ඇළ මාර්ග නඩත්තු කිරීම
- මානෙල්වත්ත විහාර වැව හැරීම
- මුතුරාජවෙල වගුරු ප්‍රදේශය වටා පර්යන්ත ඇළ මාර්ග ඉදිකිරීම
- ජාඇල, මාකේවිට යෝජිත ඇවිදීමේ මංතීරු
- පැලියගොඩ ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම් සහ නාගරික භූමි සැකසීමේ කාර්යයන්



මානෙල්වත්ත පන්සල – කැළණිය (පෙර)



මානෙල්වත්ත පන්සල – කැළණිය (පසුව)




වෙදමුල්ල වැව (පෙර)



වෙදමුල්ල වැව (පසුව)

3. කිත්තම්පහුව ඇළ මාර්ගය, කොළොන්නාව, මීතොටමුල්ල, මුල්ලේරියාව සහ අංගොඩ ප්‍රදේශයේ සහ එහි අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ කාර්යයන් සහ භූමි සැකසුම් කාර්යයන් වැඩිදියුණු කිරීම



මෙය 2014 වර්ෂය සඳහා වන ව්‍යාපෘතියක් අඛණ්ඩව සිදු කර ගෙන යෑමක් වන අතර ඇස්තමේන්තුගත මුළු මුදල රු.මි.200.00කි. 2014 වර්ෂය සඳහා සිදු කර ඇති කාර්යයන්වල මුළු වටිනාකම රු.මි. 200.23කි. **කිත්තම්පහුව, කොළොන්නාව, මීතොටමුල්ල, මුල්ලේරියාව සහ අංගොඩ** ඇළ මාර්ග පද්ධතිය රොන්මඩ තැන්පත් වී ඇති අතර විශාල වශයෙන් මතුපිට තෘණ වර්ග වර්ධනය වී ආවරණය වී ඇත. මේ හේතුවෙන්, වර්ෂා කාලවලදී මෙ ප්‍රදේශ ජලයෙන් යට වේ. එබැවින් ජල අපවහනය වැඩි දියුණුකිරීම, ඇළ මාර්ගවල මතුපිට ශුද්ධ පවිත්‍ර කිරීම, භූමි සැකසීමේ කාර්යයන් ආදිය ක්‍රියවට නැංවීමෙන් මෙම ප්‍රදේශවල ගංවතුර ඇතිවීම අවම කර ඇති අතර එය මෙම ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට ඉවහල් වී ඇත. කෙසේවුවද, කිසිදු ආයතනයකට අයත් නොවන බැවින් කිසිදු ආයතනයක් මගින් වැඩිදියුණු කිරීමක් නොකරන ප්‍රධාන සහ පර්යන්ත ඇළ මාර්ග, ඇළ මාර්ග ධාරිතාවයක් නොමැති වීමෙන් සහ පද්ධතියට සම්බන්ධවීමක් නොමැති බැවින් සුළු ගංවතුර තත්ත්ව බොහොමයක් ඇති කිරීම සඳහා හේතු වේ. මෙම ගැටළුවට විසඳුමක් ලබා දීම සඳහා මෙම ද්විතීයික ඇළ මාර්ග සංවර්ධනය කර සම්බන්ධ කළ යුතු වේ.

මෙම ප්‍රදේශය ඉහළ වාණිජ වටිනාකමකින් යුක්ත වන අතර කොළඹ නගරයට ආසන්නව පිහිටීම නිසා නේවාසික ප්‍රදේශයක්ද වේ. නගරාසන්න ප්‍රදේශවල සිට බොහෝ පිරිසක් පදිංචියට පැමිණීම හේතුවෙන් නාගරික ප්‍රදේශවල ඉඩම් සඳහා වැඩි ඉල්ලුමක් පවතී. එබැවින් අපවහන වැඩිදියුණු කිරීම් සහ නාගරික භූමි සැකසීමේ කාර්යයන් ක්‍රියාවට නැංවීමෙන් මෙම ප්‍රදේශවල සහ අවට ජීවත්වන ජනතාවට ප්‍රයෝජන සැලසේ.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- කොළොන්නාව ප්‍රදේශයේ සහ අවට ඇළ මාර්ග සංවර්ධනය කිරීම
- චන්ද්‍රිකා කුමාරණතුංග මාවත ඔස්සේ යෝජිත ඇවිදීමේ මංතීරුව
- අංගොඩ වැව ප්‍රදේශයේ හෑරීමේ සහ භූමි සැකසීමේ කාර්යයන්
- සාලමුල්ල නිවාස ව්‍යාපෘතියේ යෝජිත ගේබියන් බැම්, සතරැස් බෝක්කු
- උතුරු කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග ආරක්ෂණ කාර්යයන්
- කිත්තම්පහුව ප්‍රදේශයේ භූමි සැකසීමේ කාර්යයන්





චන්ද්‍රිකා කුමාරණතුංග මාවත ඔස්සේ යෝජිත ඇවිදීමේ මංතීරුව











අංගොඩ ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන්


4. බොල්ගොඩ වැව සහ අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ සහ භූමි සැකසීමේ කාර්යයන්


බොල්ගොඩ ඇළ මාර්ගය,කොළඹ ඇළ මාර්ග පද්ධතියේ ඇති එක් ප්‍රධාන ඇළ මාර්ගයකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගංවතුර අවදානම අඩු කිරීම, අනවසර ක්‍රියාකාරකම් වැළැක්වීම, ඇළ මාර්ගවල ගලයෑමේ ධාරිතාවය ඉහළ නැංවීම සහ ජල රැඳවුම් ප්‍රදේශ ආරක්ෂා කිරීම වේ. අවට ප්‍රදේශය වැඩිදියුණු කිරීම මෙම ඇළ මාර්ගය පවිත්‍රව තබා ගැනීම සඳහා උපකාරී වේ.

සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.100.00 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 100.23 කි.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- අත්තිඩිය ප්‍රදේශයේ සහ අවට ජලාශ සංවර්ධනය කිරීම
- පොදු ස්ථාන සහ නාගරික භූමි සැකසීමේ ප්‍රදේශ සංවර්ධනය කිරීම
- රත්මලාන ගුවන් හමුදා මූලස්ථානය තුළ පිහිටි ඇළ මාර්ගය හැරීම
- ගල්කිස්ස බෞද්ධ කාන්තා විද්‍යාලයේ යෝජිත ඉවුරු ආරක්ෂණ ගේබියන් බැම්මක් ඉදිකිරීම
- බොල්ගොඩ ඇළ මාර්ගය ඔස්සේ ඇළ ඉවුරු ආරක්ෂණ ගේබියන් බැම් ඉදිකිරීම





අත්තිඩිය ප්‍රදේශය



අත්තිඩිය වැව **III**



අත්තිඩිය වැව **II**

5. පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ සහ අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ, පරිසරය වැඩිදියුණු කිරීමේ සහ භූමි සැකසුම් කාර්යයන්

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ පාර්ලිමේන්තු පරිශ්‍රයේ සහ අවට ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීම සහ හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩිදියුණු කිරීම තුලින් ඉහළ ජලාධාර ප්‍රදේශයේ තෙත්බිම් සංරක්ෂණය කිරීම වේ. 2010 වර්ෂයේ නොවැම්බර් මස 11 දින අසාමාන්‍ය ගංවතුරෙන් පාර්ලිමේන්තු සංකීර්ණය පවා ජලයෙන් යටවීමෙන් අනාවරණය වූයේ පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ ජල රැඳවුම් ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවයි. අවට ප්‍රදේශය ජලයෙන් යට වීමෙන් වළක්වා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත.

සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.150.00 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 156.00 කි.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.


- කිඹුලාවල සහ අවට ප්‍රදේශයේ අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ භූමි සැකසීමේ කාර්යයන්
- "අපි වෙනුවෙන් අපි" සඳහා අවන්හලක් සහ අවන්හල සඳහා කිඹුලාවල රථගාලක් ඉදිකිරීම
- පැලවත්ත ප්‍රදේශයේ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම
- බත්තරමුල්ල, දියත උයනෙහි අඩි පාරක් ඉදිකිරීම සහ භූමි සැකසීමේ කාර්යයන්
- බත්තරමුල්ල, පොල්දූව පාර ඔස්සේ රථ ගාලක් ඉදිකිරීම
- රාජගිරිය-සරණ මාවත ඇළ මාර්ගයේ වැඩිදියුණු කිරීම්
- පැලවත්ත - අකුරගොඩ පිහිටි පොකුණ හැරීම
- පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ අපවහන පද්ධතිය සහ භූමි සැකසීමේ කාර්යයන් වැඩිදියුණු කිරීම
- වෝටර්ස් එජ් හි ජල රැඳවුම් වැව සහ එහි අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම
- කිඹුලාවල රථ ගාල සහ අපවහන පද්ධතිය
- දියවන්නා වැව පිහිටි ඉඩම තුළ අඩි පාරක් ඉදිකිරීම
- රුක්මල්ගම විහාරස්ථානයෙහි වැව හැරීම සහ භූමි සැකසීමේ කාර්යයන්







වෝටර්ස් එජ් ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන්







<u>කිඹුලාවල ප්‍රදේශයේ අපවහනය වැඩිදියුණු කිරීමේ සහ භූමි සැකසීමේ කාර්යයන්</u>



රුක්මල්ගම දම්විජයාලෝක විහාරස්ථානයේ යෝජිත වැව



6. හීන් ඇළ වගුරු ප්‍රදේශය, පාගොඩ ප්‍රදේශය සහ කිරුලපන-හීන් ඇළ දෙබෙදුම ඇතුළුව එහි අවට ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම් සහ නාගරික සංවර්ධන කටයුතු

මහ කොළඹ ප්‍රදේශයේ ගංවතුර ඇතිවීම වැළැක්වීම සඳහා ජල රැඳවුම් ප්‍රදේශ ලෙස පවත්වා ගැනීමට ශ්‍රීලඉගොහාසසං විසින් මෙම වගුරු ඉඩම් අත්පත් කරගෙන ඇත. කෙසේවුවද, කාලයත් සමඟ සිදු වී ඇති බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම් සහ අනවසර ඉඩම් ගොඩකිරීම් හේතුවෙන් මුල් ඉඩම් ප්‍රමාණයෙහි අඩුවීමක් සිදු වී ඇත. මෙම වගුරු බිම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමෙන් වළක්වා ගැනීම ශ්‍රීලඉගොහාසසං විශාල ගැටළුවක් වී ඇත. එබැවින් එහි ප්‍රධාන අරමුණ වන ගංවතුර පාලනය සඳහා වගුරු බිම ආරක්ෂා කිරීම සිදු කරන අතරම නාගරික පදිංචි කරුවන් සඳහා විනෝදාත්මක ප්‍රදේශයක් ලෙසද යොදාගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට යෝජනා කර ඇත.

මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.50.00ක් වන අතර සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම රු.මි. 50.10කි.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- නාවල පිහිටි හීන් ඇළ සංවර්ධනය කිරීම
- කිරුළපන ප්‍රදේශයෙහි සංවර්ධන කාර්යයන්





හීන් ඇළ වගුරු ප්‍රදේශය

7. බේරේ වැව තුළට සහ ඉන් පිටතට ගලන සියළු ඇළ මාර්ග හැරීම සහ පුනරුත්ථාපනය කිරීම

බේරේ වැවෙහි ස්ථාන කිහිපයක් සහ මෙම වැවට සම්බන්ධිත වැව තුළට සහ ඉන් පිටතට ගලන ඇළ මාර්ගවල විශාල වශයෙන් රොන්මඩ තැන්පත් වී ඇත. වැවෙහි සහ ඇළ මාර්ග පද්ධතියෙහි නඩත්තු කටයුතු සහ විවිධ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා මෙම තත්ත්වය අහිතකර අන්දමින් බලපා ඇත. ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වන්නේ වැවෙහි මෙන්ම වැව තුළට සහ ඉන් පිටතට ගලන ඇළ මාර්ග වල රොන්මඩ ඉවත් කර ශුද්ධ පවිත්‍ර කිරීම සහ ජලයෙහි තත්ත්වය සහ නඩත්තු කාර්යයන් වැඩිදියුණු කිරීමයි. ඊට අමතරව උත්තරානන්ද මාවතෙහි ඇළ මාර්ගයද හාරා ශුද්ධ පවිත්‍ර කරනු ඇත.

මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.100.00ක් වන අතර සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම රු.මි. 100.11කි.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- අක්කර 4.1ක ජලාශ ප්‍රදේශයක් හැරීම
- බැස්ටියන් මාවත පාවෙන වෙළඳ සංකීර්ණයහි සංවර්ධන කාර්යයන්
- මහවත්ත,දෙමටගොඩ සහ ශාන්ත සෙබස්තියන් ඇළ මාර්ග ඔස්සේ යෝජිත ඉවුරු ආරක්ෂණ ගේබියන් බැම්ම ඉදිකිරීම
- බේරේ වැව ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන්

බේරේ වැව





කැළණි නිම්න ද්‍රෝණිය (බේරේ)



ගාලු මුවදොර වැව

8. මාලිගාවත්ත, ඇපල්වත්ත ප්‍රදේශයේ සහ එහි අවට ප්‍රදේශයේ අපවහන වැඩිදියුණු කිරීම

වර්ෂ 1992 දක්වා ඇපල්වත්ත නැමැති ඉඩම ජල රැඳවුම් ප්‍රදේශයක් ලෙස පැවතිණි.නමුත් පසුගිය වර්ෂ 20 ක කාල පරිච්ඡේදය තුළදී එය විධිමත් ජල අපවහනයක් සහ යටිතල ව්‍යුහයක් නොමැති සැලසුම් නොකළ විශාල වශයෙන් නාගරීකරණයට ලක් වූ ප්‍රදේශයක් බවට පත්වී ඇත. එය කෙත්තාරාම ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයට යාබදව පිහිටි ඉතා ඉහළ වාණිජමය ප්‍රදේශයකි. මෙම ඉඩම සහ ආශ්‍රිත ප්‍රදේශය තවදුරටත් සංවර්ධනය කිරීමේදී යෝජිත උස් ගොඩනැගිලි ඉදිකිරීමේ දැක්මට අනුව මෙම ප්‍රදේශයේ සහ අවට ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා පිටුවහලක් වී ඇත.

රොන්මඩ සහ ඝන අපද්‍රව්‍ය තැන්පත් වීම හේතුවෙන් කුඩා ඇළ මාර්ග පද්ධතිය විධිමත්ව ක්‍රියාත්මත නොවීම, ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා බලපෑම් එල්ල කර ඇත. මාළිගාවත්ත, ඇපල්වත්ත, කෙත්තාරාමය සහ අවට ප්‍රදේශය අධික වර්ෂා අවස්ථාවලදී ජලයෙන් යට වන අතර එය මහජනයා සහ ඔවුන්ගේ වටිනා දේපල විනාශ වීම සඳහා හේතු වී ඇත. කොළඹ නගරයෙහි සහ එහි අවට ප්‍රදේශයෙහි සීඝ්‍ර දියුණුවත් සමඟ වර්ෂ ගණනාවක සිට කුණු කසල ඇළ මාර්ගවලට දැමීම සහ අවධිමත් සංවර්ධන කටයුතු හේතුවෙන් අපවහන පද්ධතිය අවහිර වීම ගංවතුර ඇතිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

ඉහත ව්‍යාපෘතිය යටතේ අප විසින් පහත කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- ඇපල්වත්ත ප්‍රදේශය සහ අවට අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ භූමි සැකසීමේ කාර්යයන්

මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.10.00ක් වන අතර සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම රු.මි. 10.7කි.



මාළිගාවත්ත ඇළ මාර්ගය



ඇපල්වත්ත ඇළ මාර්ගය

9. ලුනාව ඇළ මාර්ග පද්ධතිය, ලුනාව වැව සහ එහි අවට ප්‍රදේශය හෑරීම සහ පුනරුත්ථාපනය කිරීම



උතුරෙන් දෙහිවල ගල්කිස්ස මහනගර සභා බලප්‍රදේශයේ සිට දකුණින් මොරටුව මහනගර සභා බලප්‍රදේශය දක්වා කි.මී. 6.15ක් ආවරණය කරමින් ලුනාව වැව කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු පසින් පිහිටා ඇත. කළපුව විනාශ මුඛයට ගමන් කරමින් තිබියදී වර්ෂ 2000දී රජය විසින් ලුනාව පරිසර වැඩිදියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය අන්තර්ජාතික අරමුදල් සමඟින් ක්‍රියාවට නංවන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ ලුනාව කළපුව සහ ඇළ මාර්ග පද්ධතිය සංවර්ධනය කරන ලද අතර ශ්‍රීලඉගොහාසසං ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියෙහි කොටසක් නඩත්තු කරමින් සිටී.

කළපුව ප්‍රදේශයේ සහ අවට මෙන්ම ප්‍රධාන ඇළ මාර්ගයේ කොටසක හෑරීමේ සහ සමහර පුනරුත්ථාපන කාර්යයන් සිදු කිරීමට ඇත. මහජනතාව දර්ශනීය පරිසරයක් සකසා දීම සමාජ වගකීමක් වශයෙන් සළකමින් කළපුව සහ ප්‍රධාන ඇළ මාර්ගයේ කොටසක් ශුද්ධ පවිත්‍ර කිරීමට අප සැලසුම් කර ඇත.

ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටස් සමහරක් සහ ලුනාව කළපුව පුනරුත්ථාපනය කිරීම සඳහා මුළු ඇස්තමේන්තුව රු.මී.100.0 ක් වන ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇති අතර 2014 වර්ෂය සඳහා නිම කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මී. 100.11කි.

මෙම යෝජනාව යටතේ ශ්‍රීලඉගොහාසසං විසින් *N-1* හා *N1-iii* ඇළ මාර්ග හෑරීම, *S-1* සහ *S-2* ඇළ මාර්ග නඩත්තු කාර්යයන් සහ ලුනාව කළපුව ප්‍රදේශයේ නාගරික භූමි සැකසීම් සිදු දරන ලදී.



S1 ඇළ මාර්ගය



S2 ඇළ මාර්ගය



N1 ඇළ මාර්ගය



N1-III ඇළ මාර්ගය

10. වැව් සහ පොකුණු ඉදිකිරීම සහ පර්යන්ත ඇළ මාර්ග හැරීම මගින් ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම තුලින් ජල රැඳවුම් ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම

මහ කොළඹ ප්‍රදේශය ජලයෙන් යටවීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා මෙම වගුරු, ජල රැඳවුම් ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. කෙසේවුවද අනවසර ඉඩම් ගොඩකිරීම් හේතුවෙන් මෙම වගුරුවල විශාලත්වය අඩු වී ඇත.එබැවින් අනවසර අත්පත් කර ගැනීම්වලින් ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම මහජනතාව සඳහා විනෝදාත්මක ප්‍රදේශයක් සකස් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී.

කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධන වේගය දිනෙන් දින සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. අනවසර ව්‍යුහද ඇතුළුව ඉදිකිරීම් හේතුවෙන් ජල රැඳවුම් ප්‍රදේශ විශාල වශයෙන් අඩු වෙමින් පවතී. ආවරණය වූ ප්‍රදේශ වැඩි වීමෙන් පසට ජලය උරාගැනීමට ඇති අවස්ථාව අඩු වීම හේතුවෙන් ජලය මතුපිටන් ගලා යෑමට බලපෑම් ඇති කරනු ලබන අතර ඉහළ භූ ජල මට්ටම හේතුවෙන්ද ජලය පසට උරාගැනීම අඩු වේ. කොළඹ දිස්ත්‍රික්කයේ පහත් පිහිටීමද වැසි ජල මාර්ගවල ජලය ගලායෑමේ සීඝ්‍රතාවයට සෘජුවම බලපෑම් ඇති කරනු ලැබේ. අඩු අවනතිය සහ කුණු කසල ජල මාර්ග අවහිර වීම සඳහා වක්‍රකාරව බලපානු ලැබේ. මෙම අනවසර ගොඩකිරීම් සහ ව්‍යුහ හේතුවෙන් වැසි ජල අපවහන පද්ධතියක් ඉදිකිරීම වර්තමානයේදී වඩාත් අසීරු වී ඇති අතර සංවර්ධන ව්‍යාපෘති සඳහා මුලින් සකස් කරන ලද සැලසුම් සහ අයවැය ඇස්තමේන්තුවල සඳහන් කාලයට වඩා වැඩි කාලයක් ගත විය හැකි අතර පිරිවැයට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු විය හැක.

තවද, සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඉඩම් ගොඩකිරීම සහ බලහත්කාරයෙන් පදිංචි වූවන් විසින් ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම හේතුවෙන් වැසි ජලය තාවකාලිකව රඳවා ගන්නා ප්‍රදේශ අඩු වීමෙන් නගරය සහ එහි නේවාසිකයින් ගංවතුර අවදානමට ලක් කර ඇත. ගංවතුරෙන් ආරක්ෂා කිරීම සඳහා මෙන්ම මහජනතාව සඳහා විනෝදාස්වාදය ලැබිය හැකි ප්‍රදේශයක් සකස් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත.

මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ගුණාත්මක ප්‍රතිලාභ පහත පරිදි වේ:



- නිරන්තර ගංවතුර වැළැක්වීමෙන් නේවාසික තත්ත්වයන් වැඩිදියුණු කිරීම
- ගංවතුර මගින් ඇති වන වසංගත රෝග වැළැක්වීම
- ගංවතුර හානි වැළැක්වීමෙන්නගරය තුළ සහ අවට ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම
- වැසි ජලය මනාව අපවහනය කිරීම තුළින් ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම
- ජලය එක් තැනක රැඳී සිටීම අඩු කිරීම තුළින් ජලය නිසා ඇති වන ලෙඩ රෝග ඇතිවීම අවම කිරීම සඳහා දායක වීම
- රථ වාහන ගමනාගමනය පහසු කිරීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශයේ මාර්ග වඩාත් හොඳ තත්ත්වයකට සංවර්ධනය කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.75.00ක් වන අතර සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම රු.මි.80.63කි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

- අනවසර ගොඩකිරීම් ඉවත් කිරීම
- නීතිවිරෝධී ඉදිකිරීම් කඩා ඉවත් කිරීම
- විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ජලාශ අවට අලංකාර කිරීමේ කාර්යයන්.
- පවතින වගුරු කවදුරටත් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමෙන් වැළැක්වීම.
- ජල දූෂණය වැළැක්වීම සඳහා ජලයට සත අපද්‍රව්‍ය, මිනිස් මළ ද්‍රව්‍යය බැහැර කිරීම පාලනය කිරීම
- ගංවතුර ඇතිවීම අඩු කිරීමට හේතු වන බැවින් අවශ්‍ය ජල රැඳවුම් ධාරිතාවය නඩත්තු කිරීම
- තෙත් බිම් සහ ඒවායේ පරිසර පද්ධති ආරක්ෂා කිරීම
- විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා අවට අලංකරණය කිරීමේ කාර්යයන්
- ජල රැඳවුම් ප්‍රදේශ, නීතිවිරෝධී අත්පත්කරගැනීම් වලින් ආරක්ෂා කිරීම





වගුරු බිම්



අනවසර ඉදිකිරීම්

11. කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ගංවතුර වැළැක්වීමේ සහ වැසි ජල අපවහන ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අභිමතාර්ථය වන්නේ නගර සංවර්ධන ව්‍යාපෘතිවල සහ අවට ගංවතුර වැළැක්වීම සහ අනුරාධපුර -කුම්බිව්වන්කුලම වැව, කුරුණෑගල-නිත්තවැල්ල වැව, හම්බන්තොට-සූරියවැව, ජරාවල ආදී වැව් පුනරුත්ථාපනය කිරීමයි.

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, වැව් පුනරුත්ථාපනය කිරීම, බලහත්කාරයෙන් අත්පත් කරගන්නන් විසින් සිදු කර ඇති අනවසර ගොඩකිරීම් හැරීම සහ ඉවත් කිරීම, වැව් බැම්ම ඔස්සේ අඩිපාරක් ඉදිකිරීම සහ පරිසරය පිරිසිදුව පවත්වා ගැනීම සහ සංවර්ධනය හා සම්බන්ධිත ඇළ මාර්ග පද්ධතියෙහි වඩාත් හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම ආදිය වේ.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ, වැවෙහි ධාරිතාවය ඉහළ නැංවීම සහ අවට ප්‍රදේශය තවදුරටත් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමෙන් වැළැක්වීම, විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ජලාශ ආසන්නයේ අලංකරණ කාර්යයන්, නගර සංවර්ධන ගොඩකිරීම් සහ අවට සංවර්ධනය කිරීම් හේතුවෙන් වෙනස් වීමට ලක් වී ඇති, පවතින ඇළ මාර්ග පද්ධතිය සහ වැව් වැඩිදියුණු කිරීම ආදිය වේ.


සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.440.00ක් වන අතර සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම රු.මි.440.09කි.

මෙම යෝජනාව යටතේ 2014වර්ෂය තුළදී අප විසින් පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කර ඇත..

- වැව සංවර්ධනය කිරීම සහ කුරුණෑගල නගර ප්‍රදේශයේ භූමි සැකසීමේ කාර්යයන්
- අනුරාධපුර කුම්බිව්වන්කුලම වැව සංවර්ධනය කිරීම
- හම්බන්තොට, සූරියවැව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සඳහා පවතින වැව් නැවත සංවර්ධනය කිරීම
- දෙණියාය, ශ්‍රී පුෂ්පාරාම විහාරය සඳහා යෝජිත ගේබියන් බැම්ම, කුබහ බෝක්කුව සහ අපවහන පද්ධතිය ඉදිකිරීම

- යෝජිත වැසි ජල අපවහන පද්ධතිය - ඉමදුව නගර සංවර්ධන ව්‍යාපෘතිය
- හම්බන්තොට ජාරාවල ප්‍රදේශයේ යෝජිත සංවර්ධන කාර්යයන්
- හම්බන්තොට කඩවීදිය අපවහන පද්ධතිය සඳහා වැව් සහ ඇළ මාර්ග ඉදිකිරීම
- බෝලවලාන පිහිටි ආසියාව සඳහා XVI වැනි බෙනඩික්ට් පාප් වහන්සේ අනුස්මරණ සංස්කෘතික මධ්‍යස්ථානයේ යෝජිත පොකුණ සංවර්ධනය කිරීම
- පුවක්දෙණියේදී මා ඔය අතුරු ඇළ මාර්ගය හරහා යෝජිත සපත්තු පාලම ඉදිකිරීම
- කුරුණෑගල, නාවින්න, කඳුරුගස් හන්දිය පිහිටි කාබනික කුඹුර වටා යෝජිත අඩිපාර ඉදිකිරීම
- වාරියපොළ ශ්‍රී සුමංගල පිරිවෙන් විහාරයෙහි පිහිටි වැව සංවර්ධනය කිරීම
- ගාල්ල මහනගර සභාවේ ලන්දේසි ඇළ මාර්ගයෙහි යෝජිත අපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන්


කුරුණෑගල නගරාශ්‍රිත ප්‍රදේශයේ වැව සංවර්ධනය කිරීම සහ භූමි සැකසීමේ කාර්යයන්








<u>අනුරාධපුර කුම්බිච්චන්කුලම වැව සංවර්ධනය කිරීම</u>







බෝලවලාන පිහිටි ආසියාව සඳහා XVI වැනි බෙනඩික්ට් පාප් වහන්සේ අනුස්මරණ සංස්කෘතික මධ්‍යස්ථානයේ යෝජිත පොකුණ සංවර්ධනය කිරීම










<u>භාණ්ඩාගාර අරමුදල් ලබන ව්‍යාපෘති</u>

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්

1. කොළඹ සහ අවට පිහිටි ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග සංවර්ධනය කිරීම
   - උතුරු කොළඹ (ඔරුගොඩවත්ත) ප්‍රාදේශීය කාර්යාලය යටතේ පවතින ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග සංවර්ධනය කිරීම
   - දකුණු කොළඹ (කිරුළපන) ප්‍රාදේශීය කාර්යාලය යටතේ පවතින ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග සංවර්ධනය කිරීම
   - නැගෙනහිර කොළඹ (කිරිමණ්ඩල මාවත) ප්‍රාදේශීය කාර්යාලය යටතේ පවතින ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග සංවර්ධනය කිරීම

2. මුතුරාජවෙල පිහිටි හැමිල්ටන් ඇළ නඩත්තු කිරීම



කොළඹ ද්‍රෝණියෙහි පිහිටි ප්‍රධාන ඇළ මාර්ග පද්ධතිය ස්වභාවික අපවහන පද්ධතියකි. පද්ධතිය දෙහිවල සහ වැල්ලවත්ත මෝය හරහා සහ මෝදර කුඩා මෝයකින් සාගරයට සම්බන්ධ වන අතර නාගලගම් වීදිය සහ අඹතලේ පිහිටි අපවාන දෙකකින් කැලණි ගඟට සම්බන්ධ වේ. මීට අමතරව, බේරේ වැව මෝය හරහාද වැසි ජලය සාගරයට ගලා යයි.

වාහන තදබදයක් ඇති කරමින් සහ වාණිජ නගරයේ දෛනික ආර්ථික කටයුතු සඳහා බාධා ඇති කරමින් විනාඩි 30 වර්ෂාවකින් පවා කොළඹ ප්‍රධාන මාර්ග ජලයෙන් යට වේ.

ගංවතුර හානි වැළැක්වීමේ සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග යටතේ, මහ කොළඹ ප්‍රදේශයේ වඩාත් ගංවතුර තර්ජනයට ලක් වී ඇති ප්‍රදේශවල සංවර්ධනය නොකළ හෝ පැරණි අපවහන පද්ධති රජය විසින් වැඩිදියුණු කරනු ඇත.

ස්ථානීය ගංවතුර වැළැක්වීම සඳහා ප්‍රධාන සහ ද්විතියික අපවහන ජාලය වැඩිදියුණු කිරීම, කොළඹ මහ නගර සභාව සහ ස්ථානීය ගංවතුර වැළැක්වීම සඳහා වන නියෝජිතායතන මගින් සිදු කෙරේ.

එබැවින්, කොළඹ නගරය සිත්ඇදගන්නා සුළු නගරයක් පමණක් නොව ගංවතුර ප්‍රතිරෝධී නගරයක් කිරීම සඳහා ගංවතුර තත්ත්වය සඳහා සම්පූර්ණ විසඳුමක් ලබා දීම සඳහා ව්‍යාපෘතිය යටතේ කොළඹ නගරයේ ගංවතුර සහ අපවහන කළමනාකරණයේ ප්‍රධාන සංඝටක ඉතා ඉක්මනින් ක්‍රියාවට නැංවීමට කටයුතු කරනු ඇත.

කොළඹ නගරයේ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතිය කිලෝමීටර් 45කින් සමන්විත වේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද දිග ප්‍රමාණය 1979 වර්ෂයේදී සංස්ථාවට භාර දුන් අතර මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අදියර 1 යටතේ පුනරුත්ථාපනය කරන ලදී. 1980 වර්ෂයේදී දියවන්නා ඔය වැවක් බවට පරිවර්තනය කරන ලද අතර එහි නඩත්තු කටයුතු සඳහා සංස්ථාව වග කිව යුතු වේ.


මීට අමතරව, 2001 වර්ෂයේ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 20ක දිගින් යුත් කුඩා ඇළ මාර්ග සමහරක නඩත්තු කටයුතු සංස්ථාවට පවරා ඇත.

කැලණි ගඟ සිට මීගමුව කලපුව දක්වා හැමිල්ටන් ඇළ මාර්ගයේ නඩත්තු කටයුතු (කි.මී. 14.5ක දිගක් සඳහා) සිදු කර ඇත.

ඔරුගොඩවත්ත (උතුරු කොළඹ), කිරි මණ්ඩල මාවත (නැගෙනහිර කොළඹ), කිරුළපන (දකුණු කොළඹ) සහ මුතුරාජවෙළ ප්‍රාදේශීය කාර්යාල හතරක් සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලැබේ. මතු පිට ශුද්ධ පවිත්‍ර කිරීම, ඇළ මාර්ග හැරීම, ගේබියන් පෙට්ටි භාවිත කරමින් ඇළ මාර්ග ඉවුරු ආරක්ෂණය, ඇළ මාර්ග නඩත්තු කිරීමට අයත් වේ. අතින් පිරිසිදු කිරීමට අමතරව සංස්ථාව විසින් ඩ්‍රෙජර්ස්, එස්කැවේටර්ස්, බැකෝ යන්ත්‍ර, ට්‍රැක්ටර් සහ ටිපර් රථ වැනි යන්ත්‍රසූත්‍ර ඇළ මාර්ග සහ ඉවුරු හැරීම සහ ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා යොදවා ඇත.

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මී. 369.20 වන අතර සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මී. 433.22කි.

- උතුරු කොළඹ (ඔරුගොඩවත්ත) ප්‍රාදේශීය කාර්යාලය විසින් නඩත්තු කරනු ලබන ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග





ප්‍රධාන අපවාන ඇළ මාර්ගය



දෙමටගොඩ ඇළ මාර්ගය



මහවත්ත ඇළ මාර්ගය



ප්‍රධාන අපවානට සම්බන්ධ වන ඇළ මාර්ගය




කොළොන්නාව උතුරු ඇළ මාර්ගය




උත්තරානන්ද මාවත ඇළ මාර්ගය

- දකුණු කොළඹ (කිරුළපන) ප්‍රාදේශීය කාර්යාලය යටතේ පවතින ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග





දෙහිවල ඇළ මාර්ගය



වැල්ලවත්ත ඇළ මාර්ගය



බොල්ගොඩ ඇළ මාර්ගය



දෙහිවල ඇළ මාර්ගය (ගේබියන් නැවත සැකසීමේ කාර්යයන්)




දෙහිවල පිටවාන



වැල්ලවත්ත පිටවාන

- නැඟෙනහිර කොළඹ (කිරිමණ්ඩල මාවත) ප්‍රාදේශීය කාර්යාලය යටතේ පවතින ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග





හීන් ඇළ



හීන් ඇළ වගුර



කිරුළපන ඇළ මාර්ගය



ටොරින්ටන් උතුරු ඇළ මාර්ගය



පාගොඩ උද්‍යාන අතුරු ඇළ මාර්ගය



ගමගේවත්ත අතුරු ඇළ මාර්ගය

2. මුතුරාජවෙළ හැමිල්ටන් ඇළ මාර්ගය නඩත්තු කිරීම













වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය කලාප 03 - බෙල්ලන්විල

බෙල්ලන්විල ප්‍රදේශයේ සහ අවට ගංවතුර ගැටලුව විසඳීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත.

- ඇස්තමේන්තු වටිනාකම : රු.මි. 686.23 (බදු හැර, අමතර කාර්යයන් ඇතුළුව)
- ආරම්භ කරන ලද දිනය : 2013 මාර්තු
- ව්‍යාපෘතියේ තත්ත්වය : ව්‍යාපෘතිය නිම කර ඇති අතර නඩත්තු කටයුතු සිදු කරමින් පවතී
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි. 723.25 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන් : රු.මි. 723.25 (බදු හැර)
- සිදු කිරීමට නියමිත කාර්යයන්
    - ප්‍රධාන ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම සහ හැරීම
    - සක්ක ගල් අපවාන ඉදි කිරීම
    - බෝක්කු, හරස් වියුහ සහ ගේබියන් වියුහ ඉදි කිරීම
















සේවාදායක ව්‍යාපෘති

1. මෝදරවිල අපවහනය වැඩිදියුණු කිරීම, පානදුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II

මෝදරවිල ප්‍රදේශයේ ගංවතුර ගැටලුවට විසඳුම් ලබා දීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී.

- සේවාදායකයා :දිස්ත්‍රික් ලේකම්, කළුතර
- ඇස්තමේන්තුගත වටිනාකම : රු.මි. 54.60 (බදු හැර අමතර කාර්යයන් සමඟ)

- ආරම්භක දිනය : 23.06.2013
- ව්‍යාපෘති තත්ත්වය : සිදු කෙරෙමින් පවතී
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි. 32.2 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම : රු.මි. 6.9 (බදු හැර)
- සිදු කිරීමට නියමිත කාර්යයන්
  - ප්‍රධාන ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම සහ හෑරීම
  - සක්ක ගල් අපවාන ඉදි කිරීම
  - බෝක්කු, හරස් ව්‍යුහ සහ ගේබියන් ව්‍යුහ ඉදි කිරීම



2. තංගල්ල, කිරම ඔය රැඳවුම් බැම්මක් සහ රේඛීය උද්‍යානයක් ඉදි කිරීම

- සේවාදායකයා :ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- ඇස්තමේන්තුගත වටිනාකම : රු.මි. 93.03 (බදු හැර)
- ආරම්භක දිනය : 2014 මැයි
- ව්‍යාපෘති තත්ත්වය : සිදු කෙරෙමින් පවතී
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි. 62.9 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම: රු.මි.62.9 (බදු හැර)
- සිදු කිරීමට නියමිත කාර්යයන්
  - ඇළ ඉවුරු ආරක්ෂා කිරීම සඳහා ගේබියන් බැම්මක් ඉදිකිරීම
  - කිරම ඔය ඔස්සේ රේඛීය උද්‍යානයක් ඉදිකිරීම
  - රේඛීය උද්‍යානය තුළ සහ අවට අතුරගුළු ගල් සහ ගැටි ගල් ඇතිරීම





3. පාදුක්ක යෝජිත අපවහන පද්ධතිය සහ ක්‍රීඩාංගනය වැඩිදියුණු කිරීම

- සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
- ඇස්තමේන්තුගත වටිනාකම : රු.මි. 20.65 (බදු හැර)
- ආරම්භක දිනය : 04.07. 2014
- ව්‍යපෘති තත්ත්වය : සිදු කෙරෙමින් පවතී
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි. 10.9 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම :රු.මි.10.9(බදු හැර)
- සිදු කිරීමට නියමිත කාර්යයන්
  - ඉඩම සංවර්ධනය කිරීමේ කාර්යයන් සමඟ භූමිය වැඩිදියුණු කිරීම, භූමිය තුළ සහ අවට තණ පිඩැලි ඇල්ලීම සහ අපවහනය වැඩිදියුණු කිරීම
  - භූමිය තුළ සහ අවට ඇළ මාර්ගය වැඩිදියුණු කිරීමේ කාර්යයන්
  - කාණු ඉදිකිරීම සහ කොන්ක්‍රීට් කිරීම









4. ඇහැළියගොඩ නගර මධ්‍ය සංවර්ධනය කිරීම යෝජිත ක්‍රීඩාංගනය ඉදිකිරීම

- සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
- ඇස්තමේන්තුගත වටිනාකම : රු.මි. 173.49 (බදු හැර)
- ආරම්භක දිනය : 2014 ජූලි
- ව්‍යාපෘති තත්ත්වය : සිදු කෙරෙමින් පවතී
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රුමි. 37.6 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම : රු.මි. 37.6 (බදු හැර)
- සිදු කිරීමට නියමිත කාර්යයන්
  - ආනයනය කළ ග්‍රැවල් පස් යොදා ඉඩම සංවර්ධනය කිරීමේ කාර්යයන්
  - තණ පිඩලි සැපයීම සහ ඇතිරීම
  - ජලය බැස යන ඇළ මාර්ග සහ හතරැස් බෝක්කු ඉදිකිරීම
  - මැටියෙන් සාදන ලද ඇළ මාර්ග වැඩිදියුණු කිරීම
  - පොකුණ හැරීම
  - ගලාබසින ඇළමාර්ග ප්‍රධාන ගංගාව දක්වා ශුද්ධ පවිත්‍ර කිරීම





5. බත්තරමුල්ල රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සඳහා ඉඩම සංවර්ධනය කිරීම

බත්තරමුල්ල රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සඳහා ඉඩම සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ, ආනයනය කළ ග්‍රැවල් පස් යොදා ඉඩම සංවර්ධනය කිරීම, තණ පිඩලි සැපයීම සහ ඇතිරීම (ඇළ මාර්ග ඉවුරෙහි), ජලය බැස යන ඇළ මාර්ග සහ හතරැස් බෝක්කු ඉදිකිරීම, ඇළ මාර්ග හැරීම සහ සංවර්ධනය කරනු ලබන ප්‍රදේශයට ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම ආදියයි.

- සේවාදායකයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- ඇස්තමේන්තු වටිනාකම : රු.මි. 14.51 (බදු හැර)
- ආරම්භක දිනය : 02.05.2014
- නිම කරන ලද දිනය : 30.11.2014
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි.12.82 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම : රු.මි.12.82 (බදු හැර)






6. ගාල්ල, හීන්පන්දල පවතින ඇළ මාර්ග නැවත සංවර්ධනය කිරීම

ගාල්ල, හීන්පන්දල ඇළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ වැව හැරීම සහ ඇළ මාර්ග කැණීම සමඟින් අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම ආදියයි.

- සේවාදායකයා : දිස්ත්‍රික් ලේකම්, ගාල්ල
- ඇස්තමේන්තුගත වටිනාකම : රු.මි.4.88 (බදු හැර)
- ආරම්භ කළ දිනය : 01.01.2014
- නිම කළ දිනය : 31.01.2014
- සිදු කර කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි. 3.94 (බදු හැර)
- 2014 වර්ෂය තුළ සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම: රු.මි. 3.94 (බදු හැර)





7. මාකුඹුර නව නගර සංවර්ධන ව්‍යාපෘතිය - අදියර I සඳහා යෝජිත භූමිය සංවර්ධනය කිරීමේ කාර්යයන්

නව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාකුඹුර ප්‍රදේශයේ බහු අකෘති මධ්‍යස්ථානය ඉදිකිරීම පිණිස භූමිය සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. ආනයනය කළ ගැවල් පස්, වැලි සහිත ලෝම පස් යොදා භූමිය පිරවීම, ප්‍රදේශය තුළ සහ අවට ජල අපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන් ආදිය මෙයට අයත් වේ.

- සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
- ඇස්තමේන්තුගත වටිනාකම : රු.මි. 74.13 (බදු හැර)
- ආරම්භක දිනය : 16.10.2014
- ව්‍යාපෘති තත්ත්වය : සිදු කෙරෙමින් පවතී
- සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම : රු.මි. 36.83 (බදු හැර)
- 2014 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම: රු.මි. 36.83 (බදු හැර)





ස්වයං ව්‍යාපෘති

1. වෙරළට ඔබ්බෙන් ලබාගත් වැලි පොම්ප කිරීමේ සහ අළෙවි කිරීමේ ව්‍යාපෘතිය

ඉදිකිරීම් කර්මාන්තයේ වර්තමාන වර්ධනය හේතුවෙන් සියුම් සමාහාර සඳහා වන ඉල්ලුම ඉතා විශාල වශයෙන් ඉහළ යමින් පවතී. ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා කරන සියුම් සමාහාර වන්නේ ගංගා වැලි වන අතර ඉල්ලුම සපුරාලීම සඳහා වැඩි වශයෙන් භාවිතා කිරීම හේතුවෙන් ගං පතුලෙහි ගැඹුර වැඩිවීම, භූ ජල මට්ටම අඩු වීම, මුහුදු ජලය ගංගා ජලය හා මුසු වීම වැනි විවිධ හානිකර ප්‍රතිවිපාක ඇති වීමට හේතු වී ඇත. මෙම පාරිසරික ගැටලු හේතුවෙන් විශේෂයෙන් අනතුරට භාජනය විය හැකි ස්ථානයන්හී ගංගා වැලි හැරීම තහනම් කිරීම අවශ්‍ය වී ඇත. මෙයට විසඳුමක් වශයෙන්, ගංගා වැලි කැණීම සඳහා රජය විසින් විවිධ සීමා පැනවීමත් සමඟින් මිල ගණන් ඉහළ ගොස් ඇත. මෙය භාවිතා කරන්නන් සඳහා සෘජුවම අපහසුතාවයන් ඇති කරනවා පමණක් නොව, ඉදිකිරීම් මිල ගණන් අනවරතව ඉහළ යෑම සඳහා හේතු වෙමින් ඉදිකිරීම් කර්මාන්තයේ සමස්ත ස්ථායිතාවය කෙරෙහි වක්‍රව බලපෑම් එල්ල කරනු ලැබේ.
කොන්ක්‍රීට් සඳහා මුහුදු වැලි යොදා ගැනීම පුද්ගලයින් සහ රාජ්‍ය අංශයේ සේවාදායකයින් අනුමත කරනු ලබන්නේ කලාතුරකින් බව නියමු සමීක්ෂණයකින් අනාවරණය වී ඇත. තවද, මුතුරාජවෙල තිබූ මුල් මුහුදු වැලි තොගය හිස් වී ඇති අතර නව මුහුදු වැලි තොග රැස් කරමින් පවතින නමුත් ඒවා වර්ෂාවට නිරාවරණය විය යුතු වේ. එබැවින්, විවිධ දෘෂ්ටිකෝණවලින් මුහුදු වැලිවල යෝග්‍යතාවය සොයා බැලීම සඳහා වැඩිදුර අධ්‍යයන අවශ්‍ය වේ. මුහුදු වැලි හැරීම හේතුවෙන් ඇතිවිය හැකි පාරිසරික හානිය ගංගා වැලි හැරීමෙන් සිදු වන හානිය හා සැසඳීමේදී ඉතා අඩු වේ.

මෙම සීමාකිරීම් හේතුවෙන් අවශ්‍ය අවස්ථාවල අවශ්‍ය ප්‍රමාණයෙන් වැලි ලබා ගැනීමට නොහැකිවීම ඉදිකිරීම් කර්මාන්තයේ යෙදී සිටින පිරිස් මුහුණ දුන් ප්‍රධාන ගැටළුවක් විය. මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් මුහුදු වෙරළට ඔබ්බෙන් ලබා ගත් මුහුදු වැලි සාධාරණ මිළකට වෙළඳපොළට නිකුත් කිරීම සඳහා සහ පරිසරය සුරැකීම සහ ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාරකත්වය සඳහා සේවාවක් ලෙස අප සංස්ථාව විසින් ව්‍යාපෘතියක් දියත් කරන ලදී.






2. ' **V**

කොළඹ සහ අවට ප්‍රදේශවල ගංවතුර හානිය අවම කිරීම සඳහා පසුගිය වර්ෂවලදී අප සංස්ථාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වැනි සන්නද්ධ හමුදා සමඟ ගංවතුර වැළැක්වීමේ කාර්යයන් සිදු කර ඇත.

රේඛීය අමාත්‍යාංශය විසින් ලබා දුන් උපදෙස් අනුව කලින් කලට සන්නද්ධ හමුදා අපගේ ව්‍යාපෘති සඳහා සම්බන්ධ වී ඇති අතර විශේෂ අවස්ථාවලදී ඔවුන් පහත රාජකාරීවල යෙදී සිට ඇත.

- ශ්‍රී ලංකා නාවික හමුදාව අධීක්ෂණ කටයුතුවල යෙදී සිටි අතර ඔවුන්ගේ ජීවිත ආරක්ෂක කාර්යමණ්ඩලය සමඟින් කොළඹ ඇළ මාර්ගවල ප්‍රවාහන පහසුකම් සපයන ලදී.

- අමාත්‍යාංශය යටතේ විශේෂ අවස්ථා, ශ්‍රී ලංකා නාවික හමුදාව ඉලක්කයන් සපුරා ගැනීම සඳහා විශේෂයෙන් අවසන් කිරීමේ කාර්යයන්වල යෙදී සිටි අතර සංවර්ධනය කරන ලද මෙම නාගරික ප්‍රදේශ මනාව නඩත්තු කිරීම සඳහා සහාය දක්වන ලදී.

- ඔවුන් විසින් සත්‍ය වශයෙන් සම්පූර්ණ කරනු ලබන කාර්යයන් මත පදනම් වූ මාසික ගෙවීමේ ක්‍රමයක් යටතේ උතුරු කොළඹ ඇළ මාර්ග නඩත්තු කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඔවුන්ගේ හමුදාව 2011 වර්ෂයේ සිට අප සමඟ කටයුතු කරන ලදී.

පර්යේෂණ සහ සැලසුම් අංශය

උපදේශන සේවාවන්

සංස්ථාව විසින්, රාජ්‍ය සහ පෞද්ගලික අංශ සඳහා වැසි ජල අපවහන සැලසුම් පිළිබඳව උපදේශන කටයුතු සහ වැසි ජල අපවහනය පිළිබඳ ප්‍රධාන සැලසුම් පිළියෙල කිරීම, ගොඩනැගිලි හා පාලම් පිළිබඳව ගෘහනිර්මාණාත්මක සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ.

ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණාගාරය

සංස්ථාවේ ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණාගාරය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයතන වෙනුවෙන් භූ- තාක්ෂණ පර්යේෂණ, ජලයෙහි තත්ත්වය, පස් සහ කොන්ක්‍රීට් බ්ලොක් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. 2014 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 16.9 කි.

ව්‍යුහාත්මක සැලසුම් හා ඉදිකිරීම් අධීක්ෂණය

ගොඩනැගිලි, නිවාස සංකීර්ණ, පාලම්, බෝක්කු ආදියෙහි ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සහ ඒවායේ ඉදිකිරීම් අධීක්ෂණය සංස්ථාව විසින් භාර ගනු ලැබේ.

<u>අඩු ආදායම්ලාභීන් සඳහා වූ සාලමුල්ල නිවාස ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය</u>



අඩු ආදායම්ලාභී නිවාස ඉවත් කිරීම සඳහා වූ රජයේ ව්‍යාපෘතියට අනුව යමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ටර්න්කී (turnkey) ව්‍යාපෘතිය දියත් කර ඇත. අඩු ආදායම්ලාභී පවුල් නැවත පදිංචි කිරීම සඳහා යටිතල පහසුකම්වලින් යුත් නිවාස ඒකක ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතියකි. මහල් 12 කින් යුත්, එක් මහලක නිවාස ඒකක 18ක ගොඩනැගිල්ලක් (Aකොටස) හා එක් මහලක නිවාස ඒකක 33 ක ගොඩනැගිලි 2 කින් (B සහ C කොටස්) සමන්විත මෙම ව්‍යාපෘතියෙහි සැලසුම් හා ඉදිකිරීම් මෙයට අයත් වේ. මුළු නිවාස ඒකක ගණන 1008 කි.


සමාලෝචිත වර්ෂය තුළදී ගෘහනිර්මාණ සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සිදු කර ඇත. ව්‍යාපෘතිය 2014 වර්ෂයේ නොවැම්බර් මස සම්පූර්ණ කර ඇත.

<u>ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා නව කොටසක් ඉදිකිරීම</u>

සංස්ථාව එහි ප්‍රධාන ගොඩනැගිල්ලට නව කොටසක් එක් කිරීමට අදහස් කර ඇත. ගෘහ නිර්මාණාත්මක සැලසුම් ව්‍යුහාත්මක සැළසුම් සහ සේවා ඇදීම් සහ ඉදිකිරීම් අධීක්ෂණය මෙම අංශයට භාර දී ඇත. 2008 වර්ෂයේදී වැඩ ආරම්භ කර ඇත. උපදේශන කාර්යය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ව්‍යාපෘති පිරිවැයෙන් 7%කි. මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේ මැයි මාසය වනවිට නිම කිරීමට අපේක්ෂිතය.



<u>විනාශකාරී නොවන පරීක්ෂණ සඳහා ජාතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම - පරමාණුක බලශක්ති අධිකාරිය</u>



මෙය එක් සිව් මහල් ගොඩනැගිල්ලකින් (A කොටස), තනි මහල් පරීක්ෂණාගාරයකින් (B කොටස) සහ තෙමහල් ගොඩනැගිල්ලකින් (C කොටස) සමන්විත වන ටර්න්කී ව්‍යාපෘතියකි. A කොටසෙහි ගෘහනිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා අපගේ උපදේශන සේවා ගාස්තුව රු.මි. 12 කි. A කොටසෙහි ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.

- **<u>විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා හම්බන්තොට ප්‍රදේශයේ ගොඩනැගිලක් ඉදිකිරීම</u>**



මෙම ගොඩනැගිල්ලෙහි උපදේශකයින් වශයෙන් සංස්ථාව පත් කර ඇත. එය මහල් හතකින් සමන්විත වන ව්‍යුහයක් වන අතර ව්‍යාපෘති පිරිවැය රු.මි. 2,379කි. ගෘහනිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම නිම කර ඇත. ඉදිකිරීම් අධීක්ෂණය සිදු කරමින් පවතී. 2014 වර්ෂය සඳහා උපදේශන ගාස්තුව රු.මි. 53 කි.

- **<u>බෙලිඅත්තෙහි පොදු පහසුකම් ගොඩනැගිල්ල</u>**



මෙම ව්‍යාපෘතිය ගොඩනැගිලි සමූහයක මාදිලියෙන් ප්‍රදානය කර ඇත. එය මහල් හතරකින් යුත් ගොඩනැගිල්ලකි. සේවාදායකයා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වන නමුත් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු

ලබන්නේ පළාත් පාලන අමාත්‍යාංශය මඟිනි. ව්‍යාපෘති පිරිවැය රු.මි. 570 ක් වන අතර 2014 වර්ෂය සඳහා අපගේ උපදේශන ගාස්තුව රු.මි.15කි. ගෘහනිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම බොහෝදුරට අවසන් කර ඇත.

අපවහන සැලසුම්

ඌරුබොක්ක නගර සංවර්ධන ව්‍යාපෘතිය
රු.මි. 0.3ක උපදේශන ගාස්තුවකට ඉහත ව්‍යාපෘතිය සංස්ථාවට ප්‍රදානය කර ඇත. සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.

අකුරැස්ස නගර සංවර්ධන ව්‍යාපෘතිය
සැලසුම් සකස් කිරීමේ කාර්යයන් අවසන් කර ඇත.

කෑගල්ල යෝජිත බස් වැඩපොළ සැලසුම් කිරීම
උපදේශන ගාස්තුව රු.මි. 1.08ක් වන අතර සැලසුම් සකස් කිරීම සම්පූර්ණ කර ඇත.

කොළඹ කොටුව වෙළඳ සංකීර්ණය (චාමර්ස් ගොඩනැගිල්ල)
ඉහත ව්‍යාපෘතියෙහි උපදේශන ගාස්තුව රු.මි. 0.1 ක් වන අතර ව්‍යුහාත්මක සැලසුම් සම්පූර්ණ කර ඇත.

ඇහැළියගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය
රු.මි. 0.3ක උපදේශන ගාස්තුවකට ඉහත ව්‍යාපෘතිය සංස්ථාවට ප්‍රදානය කර ඇත. සැලසුම් සකස් කිරීම සම්පූර්ණ කර ඇත. ව්‍යාපෘති අධීක්ෂණය සිදු කෙරෙමින් පවතී.

කින්නියා නගරසභා සීමාවේ වැසි ජල අපවහන සැලසුම් සකස් කිරීම – කින්නියා නගර සභාව
රු.මි. 1.1ක උපදේශන ගාස්තුවකට ඉහත ව්‍යාපෘතිය සංස්ථාවට ප්‍රදානය කර ඇත. සැලසුම් සකස් කිරීම සම්පූර්ණ කර ඇත. පාරිසරික කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතී.

භාණ්ඩාගාර අරමුදල් ලබන ව්‍යාපෘති

තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම

සංස්ථා පනත යටතේ පළාත් පදනමින් තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම් ගැසට් කිරීම සංස්ථාව ආරම්භ කර ඇත. බස්නාහිර, දකුණ සහ මධ්‍යම පළාත් වල තෙත්බිම් මේ වනවිටත් ගැසට් කර ඇත. ඌව, වයඹ, සබරගමුව සහ උතුරු මැද තෙත්බිම් හඳුනාගෙන ඇති අතර ගැසට් කිරීම සඳහා සූදානම් කරමින් පවතී. උතුරු සහ නැගෙනහිර පළාත් වල තෙත් බිම්වල පළාත් සභා මායිම් හඳුනාගනිමින් පවතී.2014 වර්ෂය සඳහා භාණ්ඩාගාර වෙන්කිරීම රු.මි. 0.5 කි.

කළු ඔය ද්‍රෝණිය සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම්

දත්ත සමුදායක් (data base) සකස් කිරීම සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම් ලබා ගනු ලැබේ. මෙම දත්ත වර්තමාන අපවහන අධ්‍යයන සඳහා යොදා ගන්නා අතර වැසි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමේ අවස්ථාවකදී යොදාගත හැකි වේ.

වේරැස් ගංගා ද්‍රෝණිය සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම්

වේරැස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද අකෘතිය පරීක්ෂා කිරීම සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම් ලබා ගනු ලැබේ.

විවිධ අපවහන සැලසුම්

වෝටර්ස්-එජ් සහ කිඹුලාවල භාණ්ඩාගාර අරමුදල් ලැබූ සියළු කාර්යයන් සඳහා අපවහන සැලසුම් පර්යේෂණ සහ සැලසුම් අංශය විසින් සකස් කරන ලදී.

වේරැස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල සිදු වන සීඝ්‍ර නාගරීකරණය සැලසුම් නොකල ඉඩම් ගොඩකිරීම් සඳහා හේතු වී ඇත. වර්තමානයේදී වර්ෂා කාල වලදී විශාල ගංවතුර තත්ත්වයන් ඇති වූ අතර මෙම තත්ත්වය වසරින් වසර බරපතල වී ඇත. ශ්‍රීලඉගොහාසසං සහ JICA කණ්ඩායමේ සහාය ඇතිව කොළඹ පුරවර කලාපය සඳහා විස්තීර්ණ ප්‍රධාන අපවහන සැලැස්මක් සකස් කරන ලදී. මෙම අපවහන සැලැසුම් අධ්‍යයනයෙහි ශක්‍යතා අධ්‍යයනය පිළිබඳව සිදු කරන ලද වැඩිපුර අධ්‍යයන වලින් ගංවතුර වැළැක්වීම සඳහා බොල්ගොඩ උප ජලාධාරයක් වන වේරැස් ගංගා ද්‍රෝණිය සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් අවශ්‍ය බව අනාවරණය වී ඇත. එබැවින් ඉහත ව්‍යාපෘතිය 2011 දී දියත් කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ගංවතුර වැළැක්වීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් වන්නේ;

- පවතින ඇළ මාර්ග පද්ධතිය පුළුල් කිරීම,
- ඉවුරු ආරක්ෂණය,
- ගංවතුර රැඳවුම් ප්‍රදේශ සංරක්ෂණය කිරීම සහ ජලාශ සෑදීම,
- පවතින බෝක්කු සහ පාලම් වැඩිදියුණු කිරීම සහ
- නව ව්‍යුහ ඉදිකිරීම.

මුළු ව්‍යාපෘතිය අදියර කිහිපයකට බෙදා ඇති අතර නුගේගොඩ රත්තනපිටිය ඇළ මාර්ගය, බොරලැස්ගමුව උතුර සහ දකුණ ඇළ මාර්ග, මහ ඇළ සහ බොල්ගොඩ ඇළ වැඩිදියුණු කිරීම සහ වේරැස් ගඟ හැරීම අදියර I ට ඇතුලත් වේ. රේඛීය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය ශ්‍රීලඉගොහාසසං වේ.

මුළු ව්‍යාපෘති වටිනාකම රු.මි.14,227 ක් වන අතර භාණ්ඩාගාර ඇපයක් මත ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් අරමුදල් ලබා දේ. ඉඩම් අත්පත් කර ගැනීමේ මුළු පිරිවැය වන රු.මි. 1400 ද මුළු ව්‍යාපෘති වටිනාකමට ඇතුලත් කර ඇත. වේ. බලපෑමට ලක් වූ සියළු පාර්ශවයන්ට සහන සැලසීම සඳහා විශේෂ වන්දිගෙවීමේ පැකේජයක් සකස් කර ඇත. ව්‍යාපාතිය ක්‍රියාවට නැංවීම සඳහා මෙන්ම වන්දි ගෙවීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ව්‍යාපෘති ප්‍රදේශයේ භූතාක්ෂණික විමර්ශනය 2012 වර්ෂයේදී සිදු කර ඇත.

අවශ්‍ය සියළු අනුමැතීන් ලබාගැනීමෙන් පසුව අදියර I, 2013 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

ඉදිකිරීම් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට තෝරාගත් පැකේජ සඳහා තරඟකාරී ලංසු 2013 වර්ෂයේදී කැඳවන ලදී. මුලින්ම මීටර් 3056 ක් දිග නුගේගොඩ රත්තනපිටිය ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර මේ වන විටත් සිදු කරමින් පවතී. 2014 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට දිගින් 46% ක ප්‍රමාණයක් නිම කර ඇත. මෙයට ඇළ හැරීම සහ ගේබියන් ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම්, පාර්ශවික අපවහන ඉදිකිරීම් සහ ඇස්පාල්ට් මාර්ග ඉදිකිරීම් ඇතුළුව ෂීට් පයිල් ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම් ඇතුලත් වේ. නුගේගොඩ රත්තනපිටිය ඇළ මාර්ගයේ බෝක්කු සහ පාලම් වැනි හරස් මාරු ව්‍යුහ සැලසුම් කිරීම නිම කර ඇති අතර 2014 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

නුගේගොඩ-රත්තන්පිටිය ඇළ මාර්ගයේ (රත්තනපිටිය පාලමෙන් පහලට) ඔස්සේ ගේබියන් ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම සහ ඇස්පාල්ට් O&M මාර්ගය 100% සම්පූර්ණ කිරීම





නුගේගොඩ-රත්තන්පිටිය ඇළ මාර්ගයේ (රත්තනපිටිය පාලම සහ ෆ්ලෙක්ස්පෝර්ට් පාලම අතර ඇළ මාර්ගය) ඔස්සේ ගේබියන් ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම සහ ඇස්පාල්ට් O&M මාර්ගය 90% සම්පූර්ණ කිරීම





නුගේගොඩ-රත්තන්පිටිය ඇළ මාර්ගයේ (අඹගහවත්ත පාලම සහ සූරියමල් මාවත පාලම අතර ඇළ මාර්ගය) ඔස්සේ ගේබියන් ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම සහ ඇස්පාල්ට් O&M මාර්ගය සකස් කිරීම සිදු කරමින්





ගංවතුර වැළැක්වීමට අමතරව, ජලාශ්‍රිත විනෝදාත්මක ක්‍රියාකාරකම්, අත්තිඩිය කුරුළු පාරාදීසිය පුනරුත්ථාපනය කිරීම සහ ජලයෙන් ඇති වන රෝග වලින් වැළකීම වැනි වෙනත් අමතර ප්‍රතිලාභ ද

අපේක්ෂා කෙරේ.බෙල්ලන්විල වගුර ආරක්ෂා කිරීම සහ බෙල්ලන්විල වගුරෙහි ජලාශ්‍රිත ක්‍රියාකාරකම් සකස් කිරීම සම්පූර්ණ කර ඇත. මුළු ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව අවට ප්‍රදේශයේ ඉඩම්වල වටිනාකම ඉහළ යන බව ශබ්‍යතා අධ්‍යනයෙන් අනාවරණය වී ඇත. 2014 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානය දක්වා කරන ලද කාර්යයන් වල සමුච්චිත වටිනාකම රු.මි. 1500කි.

ඇවිදීමේ මංතීරු සහ පාපැදි මාර්ග වැනි ජලය ආශ්‍රිත විනෝදාත්මක ක්‍රියාකාරකම් ඇතුළුව අත්තිඩිය කුරුළු අභය භූමිය ප්‍රදේශයේ වැව වැඩිදියුණු කිරීම 100% සම්පූර්ණ කර ඇත.





මේ වනවිට සූරියමල් මාවත ප්‍රදේශයේ වැව වැඩිදියුණු සිදු කරමින් පවතී





අදියර I වර්ෂ තුනහමාරක් ඇතුලත සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

තෙත් බිම් කළමනාකරණ අංශය

නාගරීකරණයත් සමඟ ස්වභාවික සම්පත් කෙරෙහි ඇති වන තර්ජනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා 2013 වර්ෂයේ අවසන් භාගයේදී මෙම සංස්ථාවේ තෙත් බිම් කළමනාකරණ අංශය පිහිටුවන ලදී. සාමාන්‍යයෙන්, සංවර්ධන උපායමාර්ග වැදගත් පරිසර පද්ධති සේවාවන් නඩත්තු කිරීම අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් දැනුවත්භාවයක් නොමැති වීම හේතුවෙන් බොහෝ විට නොසලකා හරිනු ලැබේ. එබැවින් තෙත් බිම් සංරක්ෂණය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම තුළින් මෙම අංශය තෙත් බිම්වල පරිසර පද්ධති සහ ජෛව විවිධත්වය අධ්‍යනය කිරීම ආරම්භ කරන ලදී. ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමේ අරමුණින් නියමු ව්‍යාපෘතියක් ලෙස තලවතුගොඩ ජෛව විවිධත්ව අධ්‍යයන උද්‍යානයක් ඉදිකිරීමට තීරණය කර ඇත. අධ්‍යයන උද්‍යානය පර්යේෂණ මධ්‍යස්ථාන, පරීක්ෂණාගාර, ශාකාගාර, සමනළ උද්‍යාන, පොකුණු, ස්වභාවික අඩිපාර, කුරුල්ලන් නැරඹීමේ කුළුණු, රථවාහන අංගනයකින් මෙන්ම සනීපාරක්ෂක පහසුකම් වලින්ද සමන්විත වේ. ව්‍යාපෘතියෙහි මුල් ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 25ක් වූ අතර භාණ්ඩාගාර අරමුදල් සමඟින් ක්‍රියාවට නංවන ලදී.



කෙසේවෙතත් එකතු කිරීම් කිහිපයක් හේතුවෙන් ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 50.0 දක්වා වැඩි වී ඇත. ඉහත ඉදිකිරීම් 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2015 වර්ෂයේ මැද භාගය වනවිට නිම කිරීමට අපේක්ෂා කෙරේ.



2014 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මි.34කි. ලෝක තෙත් බිම් දිනය, ලෝක පරිසර දිනය සමරමින් වර්ෂය තුළදී රුක් රෝපණ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. උරගයින්, බලහත්කාරයෙන් අත්පත් කරගැනීම් සහ සංවර්ධනය කිරීම් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන බලපෑම් වැනි දෑ පිළිබඳ වැදගත් දේශන කිහිපයක්ද වර්ෂය තුළදී සිදු කරන ලදී. දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පාසල් ශිෂ්‍යයින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, සංස්ථා කාර්ය මණ්ඩලය මෙන්ම මෙම අංශයේ කාර්ය මණ්ඩලයද සහභාගී විය. ගණාන්තරණය (intergeneration) මෙන්ම ගණාන්තරණ තිරසර සාක්ෂාත් කරගැනීම් සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණයෙහි එවැනි ක්‍රියාකාරකම්වල වැදගත්කම ඔවුන් අවධාරණය කරන ලදී. මේ සඳහා විදේශ අරමුදල්ද මෙම වර්ෂය තුළදී ලැබී ඇත.



සහයෝගීත්ව ව්‍යාපෘති

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සමඟ සහයෝගීත්ව ව්‍යාපෘති

2014 වර්ෂයේදී තෙත් බිම් කළමනාකරණ අංශය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සමඟ සහයෝගිත්ව ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරන ලදී. මෙහි ප්‍රථම පියවර ලෙස මෙම අංශය කොළඹ විශ්වවිද්‍යාලයේ "සේවා ඉගෙනීමේ වැඩසටහනක් සමඟ සම්බන්ධ වූ අතර එම විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා විශේෂ අවසන් වසර ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍ය සීමාවාසික වැඩසටහනක් ආරම්භ කරන ලදී.

සේවා ඉගෙනීමේ වැඩසටහන


විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු සිදු කරන අතරම ස්වේච්ඡා ප්‍රජා සේවාවල යෙදීම සඳහා උපාධි අපේක්ෂකයින්ගට අවස්ථාව ලබා දීමේ අරමුණින් විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශකත්ව ඒකකය විසින් සේවා ඉගෙනීමේ වැඩසටහන 2012 වර්ෂයේදී මුලින්ම ආරම්භ කරන ලදී. එවැනි සහයෝගීත්ව ව්‍යාපෘතියක් සඳහා සංස්ථාව විශ්වවිද්‍යාලයක් හා සම්බන්ධ වූ ප්‍රථම අවස්ථාව මෙය විය. තෙත් බිම් කළමනාකරණය හා සම්බන්ධිත ව්‍යාපෘති දෙකක් සිදු කිරීම සඳහා ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් සංස්ථාව හා එක් විය. තලවතුගොඩ ජෛව විවිධත්ව අධ්‍යයන උද්‍යානයේ සමනළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා එක් ශිෂ්‍ය කණ්ඩායමක් යෙදූ අතර කොලොන්නාව වගුරෙහි තෙත් බිම් කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා අනෙක් කණ්ඩායම යොදවන ලදී. 2014 සැප්තැම්බර් මස සිය 2015 ජනවාරි මස දක්වා මාස 5 කාලයක් සඳහා සියළු ශිෂ්‍යයින් ඉහත සඳහන් කරන ලද ව්‍යාපෘති කටයුතුවල යෙදී සිටී.

තලවතුගොඩ ජෛවවිවිධත්ව අධ්‍යයන උද්‍යානයේ සමනළ උද්‍යානය

මෙම කණ්ඩායමේ ශිෂයයන් නව දෙනෙකු සේවය කරන අතර තලවතුගොඩ ජෛව විවිධත්ව අධ්‍යයන උද්‍යානයේ දූපත් අංක 1 හි පර්චස් 100 පමණ ඉඩම් ප්‍රමාණයක් සමනළ උදානය ඉදිකිරීම සඳහා තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ නරඹන්නන් සඳහා සමනළයින් පිළිබඳව, ධාරක සහ මල්පැණි ශාක පිළබඳව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම් සිදු කල හැකි දර්ශීය සමනළ උද්‍යානයක් ඉදිකිරීම සහ අධ්‍යයන උද්‍යානයේ සමනළ විවිධත්වය ඉහළ නංවා ගැනීමයි. ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු. 992,000.00කි. මුලින්ම ශිෂ්‍යයින් විසින් උද්‍යානයේ සමනළයින් පිළිබඳව සමීක්ෂණයක් සිදු කරන ලද අතර උද්‍යානය ඉදිකරන අතරම බහුවිධ සමීක්ෂණ සිදු කරමින් සිටී.

මෙම උද්‍යානය ප්‍රධාන වශයෙන් ධාරක සහ මල්පැණි ශාකවලින් සමන්විත රෝපණ ප්‍රදේශයකින්, සමනළ ජීවන චක්‍රය ඉදිරිපත් කරන ප්‍රදේශයකින්, තොරතුරු ලබාදෙන ස්ථාන, විවේක ස්ථාන පැල තවානක්, මඩ සහිත ප්‍රදේශ සහ පාලම් වලින් සමන්විත පොකුණකින් සමන්විත වේ. මෙහි රෝපණය කර ඇති ශාක වලින් බොහොමයක් ආවේණික ශාක වර්ග වන අතර ආක්‍රමණශීලී නොවන විදේශීය ශාකද රෝපණය කර ඇත. උද්‍යානයෙහි පස වගුරු බිම්වල නොවැඩෙන ශාක සඳහා වඩාත් සුදුසු නොවන බැවින් ශාක රෝපණය කිරීමට ප්‍රථම ශිෂ්‍යයින් විසින් කාබනික පොහොර යොදා ගනිමින් පසට ප්‍රතිකාර කිරීම සඳහා විශේෂ පාංශු ප්‍රතිකාර ක්‍රමයක් භාවිතා කරන ලදී.

ශිෂ්‍යයින් දිනපතා සේවය කරන අතර තලවතුගොඩ ජෛව විවිධත්ව අධ්‍යයන උද්‍යානයේ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සියළු කාර්යයන්වල නියැලී සිටී. කාර්යයන්වලින් 95%ක් පමණ මේ වනවිට අවසන් කර ඇති අතර රුක් රෝපණය සහ ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම වාගේ නිම කර ඇත.



වැඩබිම් සැලසුම













කොලොන්නාව තෙත් බිම් ව්‍යාපෘතිය

කොලොන්නාව වගුරෙහි තෙත් බිම් සංවර්ධන සහ කළමනාකරණ ව්‍යාපෘතියකින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු. 200,000.00කි. මූලදී මුළු කොලොන්නාව වගුර සඳහාම සම්පූර්ණ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කලද කාලය සීමිත වීම හේතුවෙන් ව්‍යාපෘති කාලසීමාවේදී මූලික අදියර පමණක් සම්පූර්ණ කිරීමට තීරණය කරන ලදී. මූලික අදියර “තෙත් බිම් අධ්‍යයන මධ්‍යස්ථානය” ලෙස නම් කරන ලද අතර මෙම අදියරෙහි අරමුණු වූයේ තෙත් බිම් අධ්‍යයන සඳහා ස්ථානයක් සැපයීම, වැඩි නරඹන්නන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සහ කොලොන්නාව වගුරෙහි වාසස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම වේ. මෙම අධ්‍යයන මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් ස්වභාවික මංමාවත්, තොරතුරු කවුළු වලින් සමන්විත විවෘත අධ්‍යයන ප්‍රදේශවලින් සමන්විත වේ. මෙම අධයන මධ්‍යස්ථානයේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ තෙත් බිම් කළමනාකරණ උපායමාර්ගය යටතේ කොලොන්නාව වගුරෙහි සිදු කරනු ලබන ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා පහසුකම් සැපයීම වේ. ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී මේ වනවිට ස්වභාවික මංමාවත්, ආසන 50ක ධාරිතාවයකින් යුත් විවෘත අධ්‍යයන ප්‍රදේශ, බංකු සහ පාලම් සහිත විවේක ස්ථාන ඉදිකර ඇත. වාසස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඇළ ඉවුර ඔස්සේ තිබූ වෙල් ආතා ශාක කොටස් වශයෙන් ඉවත් කර ආදේශක විශේෂ ලෙස ආවේණික වගුරු බිම් ශාක හඳුන්වා දී ඇත. ව්‍යාපෘති කාර්යයන්ගෙන් 95%ක් පමණ මේ වනවිට සම්පූර්ණ කර ඇති 2015 ජනවාරි මස අවසන් වීමට ප්‍රථම ඉතිරි කාර්යයන් සම්පූර්ණ කරනු ඇත.



විවෘත අධ්‍යයන ප්‍රදේශය



වෙල් ආතා ශාක ඉවත් කිරීම





ස්වභාවික මංපෙත් සකස් කිරීම

විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා සීමාවාසික වැඩසටහන

තෙත් බිම් කළමනාකරණ අංශය විසින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා සීමාවාසික වැඩසටහනක්ද 2014 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, කොළඹ විශ්වවිද්‍යාලයේ භූවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයන් දහනව දෙනෙක් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස සිට 2015 වර්ෂයේ ජනවාරි සාමය දක්වා මාස 5 ක කාලයක් සතියකට දින තුනක් මෙම අංශයේ සේවය කරමින් සිටී. සමහර ශිෂ්‍යයින් ප්‍රධාන කාර්යාලයේ සේවය කරන අතර සමහරක් තලවතුගොඩ ජෛව විවිධත්ව අධ්‍යයන උද්‍යානයේ සේවය කරමින් සිටී. ඔවුන් ප්‍රධාන වශයෙන් කාර්යාල වැඩකටයුතුවල (ඉඩම් නිරවුල් කිරීමේ ලිපිගොනු සහ අනවසර ඉඩම් ගොඩකිරීමේ ලිපිගොනු සම්බන්ධයෙන්), තලවතුගොඩ ජෛව විවිධත්ව අධ්‍යයන උද්‍යානයේ අනුරූපණ සහ ක්ෂේත්‍ර කාර්යයන් වල නිරතව සිටී.

බේරේ වැවෙහි ජල දූෂණය සඳහා පිළියමක් සොයා ගැනීම සඳහා කටයුතු කිරීම මෙම අංශය විසින් වර්ෂය තුළ සිදු කරන ලද තවත් එක් වැදගත් කාර්යයකි. මේ සම්බන්ධයෙන් දේශීය සහ විදේශීය විශේෂඥයින්ගෙන් යෝජනා කිහිපයක් ලැබිණි. දූෂණය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ඉතා ඉහළ ඇල්ගී ඝනත්වය වන බව හඳුනාගෙන ඇත.හෑරීම, එලදායී ක්ෂුද්‍ර ජීවීන් එක් කිරීම, ඇල්ගීනාශක භාවිතා කිරීම, වාතනය කිරීම පර්යේෂණ මට්ටමින් සිදු කරන ලදී. එක් වැදගත් යෝජනාවක් වූයේ පාවෙන තෙත් බිමක් ඉදිකිරීමයි. මේ වනවිටත් ඔවුන් පර්යේෂණ මට්ටමේ සිටී.

මායිම් නැවත විවෘත කිරීම සහ අනවසර ව්‍යුහ ඉවත් කිරීම

2013 වර්ෂයේදී ආරම්භ කරන ලද මායිම් නැවත විවෘත කිරීම 2014 වර්ෂය තුළද සිදුකරන ලද අතර 2015 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිතය. ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.60කි. 2014 වර්ෂය තුළදී සිදු කරනලද කාර්යයන්වල විටිනාකම රු.මි. 25කි.

තෙත් බිම් කළමනාකරණ උපායමාර්ගයක් සකස් කිරීම

කිසිදු සංරක්ෂණ ව්‍යාපෘතියකට යෑමට ප්‍රථම ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමෙහි තිරසර කළමනාකරණ උපායමාර්ගයක් ඉතා වැදගත් අවශ්‍යතාවයක් වන බව හඳුනාගෙන ඇත. එබැවින් තෙත් බිම් කළමනාකරණ උපායමාර්ගයක් සකස් කිරීමට තීරණය කරන ලදී. නමුත් විෂය සම්බන්ධයෙන් පවතින දැනුම ප්‍රමාණවත් නොවිණි. එබැවින් එම කාර්යය පිටත ආයතනයක් ලවා ඉටු කර ගැනීමට තීරණය කරන ලදී. රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙහි (MCUDP) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ව්‍යාපෘතිය ටෙන්ඩර් කරන ලදී. 2014 වර්ෂයේ මුල් භාගයේදී කැමැත්ත දැක්වීමේ ප්‍රකාශන (EOI) ලබා ගන්නා ලදී. තාක්ෂණික සහ මූල්‍යමය ඇගයීමකින් පසුව “SIGNES” ආයතනය තෝරා ගන්නා ලදී. ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො.මි. 229,855.00කි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය මේ වනවිට සිදු කරමින් පවතී.

ඉඩම් නිරවුල් කිරීමේ කාර්යයන්

විධිමත් ජල අපවහන පද්ධතියක් යොදා නොගන්නා, අවසර ලබාදිය නොහැකි සංවර්ධන කටයුතු ඉහළ නංවමින් මුළු ජනගහනයෙන් අර්ධයකට වඩා වැඩි පිරිසක් නාගරික ප්‍රදේශවල ජීවත් වේ. මෙමගින් විශේෂයෙන් පහත් බිම් ප්‍රදේශවල නිරන්තරයෙන් ගංවතුර ඇති වේ. එබැවින් ඉංජිනේරු ජල විද්‍යාවට අනුව විධිමත් අපවහන පද්ධති සැපයීම ඉතා වැදගත් වේ.
සැලසුම් කමිටුවක් විසින් අනුමත කරන ලද ජල අපවහන තත්ත්වයන් ක්‍රියාවට නැංවීමට යටත්ව ජල අපවහන යෝජනා ලබාදීම සහ පහත්බිම් සංවර්ධනය සඳහා අනුමැතිය ලබා දීමෙන් තෙත් බිම් කළමනාකරණ අංශය මෙ කාර්යය සිදු කරමින් පවතී. ඉඩම් නිරවුල් කිරීමෙන් 2014 වර්ෂයේදී මෙම අංශය රු.මි.6.7ක අදායමක් උපයාගෙන ඇත.

ලිපි ගොනුවක් විවෘත කර ඉඩම් සංවර්ධනය කිරීම සඳහා වන සංස්ථාවේ නීති සහ රෙගුලාසි අනුව කටයුතු කරලෙන යෑම සඳහා එකඟත්වය ප්‍රකාශ කල කෘෂි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ඉල්ලීම් ලිපියක් සමඟින් කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීම සළකා බැලිය හැකි වේ. කුඹුරු ඉඩම් නොවන ඉඩම් සඳහා ඉල්ලුම්කරුටම (පෞද්ගලික දේපල) ලිපිගොනු විවෘත කර ගත හැකි අතර සැලසුම් කමිටු තීරණය අදාල ඉල්ලුම්කරු වෙත යවනු ලැබේ. සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ එකඟත්වය අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු වේ.

විශේෂ ව්‍යාපෘති අංශය

1. **M**

කොළඹ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

අරමුදල් සපයන ආයතනය : ලෝක බැංකුව

2010 වර්ෂයේ ඇති වූ ගංවතුර මගින් ඉහළ ආර්ථික හානි ඇති කරමින් කොළඹ නගරයේ වාණිජ සහ පරිපාලන මධ්‍යස්ථානය ජලයෙන් යටවීම හුවා දක්වන ලද අතර ස්වභාවික ආපදාවන්ට ඔරොත්තු දීමට නගරයට ඇති හැකියාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. අපවහන පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, අපවහන පද්ධති නඩත්තු නොකිරීම, ගංවතුර රැඳවුම් ප්‍රදේශවල බලහත්කාරයෙන් පදිංචි වීම, සහ කාර්මික දූෂණය, සීඝ්‍රයෙන් වෙනස්වන කාලගුණික රටා සමඟ එක්ව නිරන්තර සහ වඩාත් තදබල වර්ෂාවන්, මෙම සියළු සාධක නගරයෙහි ගංවතුර අවදානම ඉහළ නැංවීම සඳහා දායකත්වය දක්වනු ලැබේ. මෙම ගැටලු සඳහා විසඳුම් ලබා නොදුනහොත් කොළඹ නගරය අත්‍යවශ්‍ය සහ සාර්ථක පුරවරයක් බවට පරිවර්තනය කළ නොහැකි වේ.

කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් කොළඹ ජල ද්‍රෝණියෙහි ජලාධාර ප්‍රදේශයේ ගංවතුර ඇතිවීම අඩු කිරීමට සහ කොළඹ, දෙහිවල-ගල්කිස්ස, ශ්‍රී ජයවර්ධනපුර-කෝට්ටේ සහ කොලොන්නාව පළාත් පාලන බලප්‍රදේශ හතරෙහි ධාරිතාවය ශක්තිමත් කිරීම, තෝරාගත් ප්‍රධාන ආදර්ශන ව්‍යාපෘති තුලින් ප්‍රමුඛත්ව පළාත් යටිතලවසුහ සහ සේවාවන් පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මධ්‍යමව කළමනාකරණය කෙරේ.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හි සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොභාසසං) යටතේ ක්‍රියාවට නංවනු ලබන ප්‍රධාන සංඝටකය වන්නේ ගංවතුර සහ අපවහන කළමනාකරණයයි. කොළඹ පුරවර කලාපයේ අපවහන ජාලය වැඩිදියුණු කිරීම සඳහා ඉතා වැදගත් බවට හඳුනාගත් ප්‍රමුඛත්ව ගංවතුර සහ අපවහන කළමනාකරණ යටිතලවසුහ පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මෙය සහාය දක්වනු ඇත. පවතින අපවහන පද්ධතියේ පිටතට ගැලීමේ ධාරිතාවයන් වැඩිදියුණු කිරීමට, නව හැරවුම් ඇළ මාර්ග සහ වැසි ජල පොම්ප කිරීමේ ස්ථාන හඳුන්වාදීමට මෙමගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරේ.

ජල රැඳවුම්/තෙත් බිම් ප්‍රදේශ අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම, අපවහන පද්ධති ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම, අන්තර්-නියෝජිතායතන සම්බන්ධීකරණය අධීක්ෂණය සහ වැඩිදියුණු කිරීම මගින් අපවහන පද්ධතියෙහි දීර්ඝ කාලීන තිරසාරකත්වය සහතික කිරීමේ මාර්ගය වන ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම සඳහාද මෙම ව්‍යාපෘතිය සහාය දක්වනු ඇත.

ක්‍රියාවට නංවා ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය

- **දෙහිවල ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ ඉදිකිරීමේ කාර්යයන්**

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/01
කොන්ත්‍රාත්තරු : සිකොයාර් මෙක් ඉංජිනියරින් (පෞද්) සමාගම
කොන්ත්‍රාත් වටිනාකම : රු. 193,846,838.92
ආරම්භ කළ දිනය : 20.05.2013
ව්‍යාපෘති කාලසීමාව : මාස 12
ලබා දී ඇති දීර්ඝ කිරීමේ කාලය : සති 6

කොළඹ දෝණියෙන් සෘජුවම සාගරයට වැසි ජලය මුදා හරින ප්‍රධාන ඇළ මාර්ගවලින් එකකි දෙහිවල ඇළ මාර්ගය. ඇළ මාර්ගය ආරම්භල ස්ථානයේ සිට ගාලු පාර පාලම දක්වා ඇළ මාර්ගයෙහි දෙපැත්තෙහිම ගේබියන් බැම්ම සහ යකඩ තහඩු පයිල් බැම්ම යොදා ආරක්ෂා කරන ලදී. ගාලු පාර පාලම සිට දුම්රිය පාර පාලම දක්වා වන ඇළ මාර්ග කොටස පස් වලින් යුක්ත වන අතර අරක්ෂා කර නොමැත. තවද, ස්ථාන කිහිපයක ඇළ මාර්ග පතුලෙහි පවතින පාෂාණ නෙරුම් සහ දුම්රිය පාලමට ඉහළ කොටසෙහි ජලය බැසයෑමට මහපෙන්වන විධිමත් බැම්ම් නොමැති වීම මෙම වැසි ජල අපවහන ඇළ මාර්ගයේ ජලය බැසයෑමේ ධාරිතාවයට අවහිරතා ඇති කරන බව නිරීක්ෂණය කර ඇත.

ඇළ මාර්ගයෙහි මුළු දිග ප්‍රමාණය කි.මී. 3.8කි.බොල්ගොඩ දෙමෝය දක්වා ඇළ මාර්ගයෙහි පළල මීටර් 10ක් වන අතර ඉන් පසුව එය මීටර් 24ක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් දක්වා වෙනස් වේ. ගාලු පාර පාලමෙහි සහ දුම්රිය පාලමෙහි පළල පිළිවෙලින් මීටර් 17ක් සහ මීටර් 15කි වේ.

<u>ව්‍යාපෘති අරමුණු</u>

i. ඇළ ඉවුරු මායිම් ස්ථිර ලෙස නියම කිරීම සහ එමගින්;
   - ඇළ මාර්ගය විධිමත්ව සකස් කිරීම සහ ජලය බැසයෑමේ ධාරිතාවය වැඩි කිරීම
   - ඇළ ඉවුරු සෝදාපාළුව වැළැක්වීම
   - ඇළ ඉවුරුවල බලහත්කාරයෙන් පදිංචි වීම වැළැක්වීම සහ නඩත්තු කටයුතුවලට පහසුවීම සඳහා එක් එක් පැත්තෙහි අවම වශයෙන් මීටර් 3.5ක් පළල මෙහෙයුම් මහ නඩත්තු මාර්ග සකස් කිරීම

ii. ඇළ මාර්ග පතුලෙහි පවතින පාෂාණ නෙරුම් ඉවත් කිරීමෙන් ඇළ මාර්ග පතුල මට්ටම -1.0 m MSL ට සකස් කිරීම (සැලසුම් කළ පරිදි)

2014 දෙසැම්බර් මස 31 දක්වා මූල්‍යමය ප්‍රගතිය : රු. 128,230,214.30
2014 දෙසැම්බර් මස 31 දක්වා භෞතික ප්‍රගතිය : 90%
ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය : 2015 ජනවාර් 31





- **අලුත් මාවත බෝක්කුව, මෝදර හතරැස් අපවාහන, මෝදර උමඟ, මනුබිල ඉදිකිරීම, මෝදර මෝයෙහි ඉවුරු වැඩිදියුණු කිරීම සහ ප්‍රධාන අපවාහනෙහි ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්**

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/02
කොන්ත්‍රාත්තරු : එඩ්වර්ඩ් ඇන්ඩ් ක්‍රිස්ටි
කොන්ත්‍රාත් වටිනාකම : රු. 409,971,109.35
ආරම්භ කළ දිනය : 27.11.2012
ව්‍යාපෘති කාලසීමාව : මාස 18

1990 වර්ෂයේ මුල් භාගයේදී මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අදියර I යටතේ ප්‍රධාන අපවාහන පුනරුත්ථාපනය කරන ලදී. ප්‍රධාන අපවාහන විවෘත ඇළ මාර්ගකින්, මාර්ග හරස් මාරු ව්‍යුහ හයකින්, භූගත RC හතරැස් අපවාහනකින්, මුට්වාල් උමඟෙන් සහ මෝයෙන් සමන්විත වේ. ඇළ මාර්ගය කි.මී. 1.7ක දිගින් යුතු වන අතර පතුලෙහි පළලෙහි සාමාන්‍යය මීටර් 8කි. ඇළ මාර්ගයේ පතුලෙහි මට්ටම -1.0 m MSLක් වන අතර ඉහළ මට්ටම +2.0 m MSLකි.

<u>ව්‍යාපෘති අරමුණු</u>


- අලුත් මාවත බෝක්කුව කඩා නැවත ඉදිකිරීම.
- මෝදර උමඟෙහි පිටතට ගැලීමේ ප්‍රදේශය සහ පිවිසුම් ප්‍රදේශය විධිමත්ව සකස් කිරීම.
- ප්‍රධාන අපවාහනෙහි ආරක්ෂා නොකළ ඉවුරු සඳහා ගේබියන් බැම් යෙදීම තුලින් මෝදර මෝයෙහි උපරිම ගලා බැසීමේ ධාරිතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම.

2014 දෙසැම්බර් මස 31 දක්වා මූල්‍යමය ප්‍රගතිය : රු. 313,798,246.20
භෞතික ප්‍රගතිය: 100%
ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය: 2014 ඔක්තෝබර් 31









- **ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගයෙහි ඇළ ඉවුරු ආරක්ෂණ ඉදිකිරීමේ කාර්යයන්**

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/03A
කොන්ත්‍රාත්තරු : ඇක්සස් ඉංජිනියරින් පිඑල්සී
කොන්ත්‍රාත් වටිනාකම : රු. 259,750,715.74
ආරම්භ කළ දිනය : 27.10.2014
ව්‍යාපෘති කාලසීමාව : මාස 18

මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අදියර I යටතේ ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගය පුනරුත්ථාපනය කරන ලද අතර එය විවෘත ඇළ මාර්ගයකින්, හරස් මාරු ව්‍යුහ හතකින් සහ පොම්ප කිරීමේ ස්ථානයක් සමඟ දකුණු දියගුලු දොරකින් සමන්විත වේ.

ඇළ මාර්ගයේ දිග කි.මී.2.0 ක් වන අතර පතුලෙහි පළල මීටර් 10 සිට මීටර් 22 දක්වා හෝ ඊටත් වඩා වෙනස් වේ.

ව්‍යාපෘති අරමුණු

- **ඇළ ඉවුරු මායිම් ස්ථිර ලෙස නියම කිරීම සහ එමගින්;**
    - **ඇළ මාර්ගය විධිමත්ව සකස් කිරීම සහ ජලය බැසයෑමේ ධාරිතාවය වැඩි කිරීම**
    - **ඇළ ඉවුරු සෝදාපාළුව වැළැක්වීම**
- ඇළ මාර්ග පතුල -1.0 m MSL ට පිහිටුවීම (සැලසුම් කල පරිදි)

2014 දෙසැම්බර් මස 31 දක්වා මූල්‍යමය ප්‍රගතිය : රු. 31,790,636.72
භෞතික ප්‍රගතිය: 1.16%
ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය: 2016 අප්‍රේල් 18






MCUDP යටතේ ක්‍රියාවට නැංවීමට නියමිත නියමිත වෙනත් උප ව්‍යාපෘති

- ශාන්ත සෙබස්තියන් උතුරු දියගුල් සහ පොම්ප කිරීමේ ස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම
- නව මෝදර උමඟ සැලසුම් කිරීම සහ ඉදිකිරීම
- ටොරින්ටන් උමඟ සැලසුම් කිරීම සහ ඉදිකිරීම
- කොලොන්නාව ඇළ මාර්ග හැරවුම සැලසුම් කිරීම සහ ඉදිකිරීම
- මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනාක්‍රමය-අදියර I වැඩිදියුණු කිරීම
- මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනාක්‍රමය-අදියර II වැඩිදියුණු කිරීම
- ශාන්ත සෙබස්තියන් නව දකුණු හැරවුම ඉදිකිරීම
- ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම
- වැල්ලවත්ත ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ ගාලු පාර පාලමෙන් ජලය බැසයෑම වැඩිදියුණු කිරීම
- දෙමටගොඩ ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම
- ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් පිහිටුවීම
- බෝට්ටු ප්‍රවාහනය, තටාකාංගන, අඩිපාර ආදිය සමඟින් අපවහන පද්ධති කළමනාකරණ වැඩිදියුණු කිරීම්

ඉහත සඳහන් කර ඇති උප ව්‍යාපෘති සඳහා සංකල්පික සැලසුම් වාර්තා සකස් කිරීම, යෝජිත මැදිහත්වීම් සඳහා සවිස්තර සැලසුම් ක්‍රියාත්මක කිරීම, ටෙන්ඩර් ඇඳීම් සකස් කිරීම, පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, ටෙන්ඩර් කැඳවීම සහ ව්‍යාපෘති අධීක්ෂණය සිදු කෙරෙමින් පවතී.

2. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා අපවහන අධ්‍යයන


අරමුදල් සැපයීමේ නියෝජිතායතනය : රජයේ භාණ්ඩාගාරය

කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ බොහොමයක් කැළණි ගඟේ පිටාර තැන්නෙහි පිහිටා ඇත. ප්‍රදේශයෙන් කොටසක්, කොළඹ නගරය කැළණි ගඟේ ගංවතුරෙන් ආරක්ෂා කර ගැනීම සඳහා 1935 වර්ෂයේ ඉදිකරන ලද ගංවතුර ආරක්ෂක බැම්මකින් (හොවාර්ඩ් බැම්ම ලෙස හඳුන්වන) ආරක්ෂා වී ඇත.ගංවතුර බැම්මෙන් ඉහළ කොටසේ සිට කැළණි ගඟ දක්වා ප්‍රදේශය (අනාරක්ෂිත ප්‍රදේශය) අපවහන අධ්‍යයනය සඳහා සළකා බලනු ඇත.

<u>ව්‍යාපෘති අරමුණු</u>

කොලොන්නාව ජලාධාර ප්‍රදේශයේ නිරන්තර ගංවතුර ඇතිවීම අඩු කිරීම පිණිස විශේෂිත ආගමන කාලවධියක් සඳහා ප්‍රදේශය තුළ අපවහන අධ්‍යයනයක් සිදු කිරීම සහ පළාත් යටිතලවැුහ සහ සේවාවන් පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා කොලොන්නාව මහනගර කලාපයේ පළාත් පාලන ආයතනවලට සහාය වීම.

ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි. 20
ව්‍යාපෘති කාලසීමාව : මාස 18
2014 දෙසැම්බර් මස 31 දක්වා මූල්‍යමය ප්‍රගතිය: රු.මි. 11
2014 වර්ෂය සඳහා භෞතික ප්‍රගතිය: 55%


Kolonnawa Canal Network
N
W
E
S
Secondary canal
A-B
KELANI
A-B-C
D-E-F
K-J
E-Q
L-M
H-I
O-N
P-Q
R-S
J-K
Kittampahuwa
T-U
E-V
W-X
Sedawatta Waewatta
Legend
Kolonnawa Canal Network
Kolonnawa Catchment Boundry
0.3
0.15
0
0.3
0.6
0.9
1.2
Miles

ඉදිකිරීම් අංශය


1. නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය – කොළඹ නගරය, කොළඹ 06 මයුර පෙදෙසෙහි නිවාස ඒකක 120 ක් ඉදිකිරීම- *නාගරික සංවර්ධන අධිකාරිය විසින් අරමුදල් සපයනු ලැබේ*

නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - කොළඹ නගරය, යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. සංස්ථාව ඉදිකිරීම් කාර්යයන් භාරගෙන ඇත.



පැති පෙනුම

රු.මී. 385 ක මුළු පිරිවැයක් දරමින් නිවාස 120 කින් සමන්විත මහල් 12 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. එක් නිවාසයක්, නිදන කාමර දෙකකින්, මුළුතැන්ගෙයකින්, විසිත්ත කාමරයකින්, නාන කාමරකින් සහ සඳළු තලයකින් සමන්විත වේ.ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණය වර්ග අඩි 84,000.



නිවසක කොටස්





භාණ්ඩ භූමිය සැකසීමේ කාර්යයන්




ව්‍යුහාත්මක කාර්යයන් (අදියර I) සහ නිම කිරීමේ කාර්යයන් (අදියර II) 2014 වර්ෂයේ මැයි මාසය අවසානයේදී සම්පූර්ණ කරන ලදී.

2014 වර්ෂය තුළ සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 199 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 448 කි.

2. නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය – කොළඹ නගරය.
කොලොන්නාව, සාලමුල්ලෙහි නිවාස ඒකක 1008 ක් ඉදිකිරීම
අරමුදල් සැපයීම නාගරික සංවර්ධන අධිකාරිය විසිනි

නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - කොළඹ නගරය, යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලද අතර මෙම සංස්ථාව සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විය. A, B සහ C වශයෙන් නම් කරන ලද මහල් 12 කින් යුත් ගොඩනැගිලි තුනක් ඉදිකිරීම එයට අයත් විය. A කාණ්ඩය නිවාස ඒකක 18කින් සමන්විත වූ අතර B සහ C කාණ්ඩවල එක් මහලක් නිවාස ඒකක 33 කින් සමන්විත විය.

පයිල් කිරීමේ කාර්යයන්ද ඇතුළුව මුළු ව්‍යාපෘති ඇස්තමේන්තුව රු.මි. 2726.56 කි.





එක් නිවාසයක්, නිදන කාමර දෙකකින්, විසිත්ත කාමරයකින්, මුළුතැන්ගෙයකින්, පැන්ට්‍රියකින්, නාන කාමරකින් සහ සඳළු තලයකින් සමන්විත වේ.









නිවසක ඇති මූලිකාංග





තරාලය

ව්‍යාපෘතිය2011 අප්‍රේල් මස ආරම්භ කරන ලද අතර A කාණ්ඩය හා B සහ C කාණ්ඩවල උප ව්‍යුහය 2014 දෙසැම්බර් මස සම්පූර්ණ කරන ලදී. A කාණ්ඩය සඳහා සිදු කරන ලද කාර්යයන් වල සමුච්චිත වටිනාකම රු.මි. 563.26ක් වන අතර B සහ C කාණ්ඩවල රු.මි. 394.63කි.



B සහ C හි සැලැස්ම

3. කැළණිය, වෙදමුල්ල පරමාණුක බලශක්ති අධිකාරියේ විනාශකාරී නොවන පරීක්ෂණ සඳහා යෝජිත ජාතික මධ්‍යස්ථානය - "A" කාණ්ඩය - *පරමාණුක බලශක්ති අධිකාරිය විසින් අරමුදල් සපයනු ලැබිණි*

බලශක්ති අධිකාරියේ විනාශකාරී නොවන පරීක්ෂණ සඳහා ජාතික මධ්‍යස්ථානය (NCNDT) සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ව්‍යාපෘතියට අයත් විය.

සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු ශ්‍රීලඉගොහාසසං වේ. ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.309කි. ව්‍යාපෘතිය 2012 වර්ෂයේ ජූනි මස ආරම්භ කර ඇති අතර 2014 වර්ෂයේ ඔක්තෝබර් මස සම්පූර්ණ කර ඇත.









2014 වර්ෂය තුළ සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 250ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 416 කි.

4 හම්බන්තොට, සූරියවැව නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය සඳහා යෝජිත දෙමහල් නිවාස ඉදිකිරීම- ***අරමුදල් සැපයීම හම්බන්තොට සංවර්ධන අරමුදල මගිනි***


නිවාස 15ක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් විය.. එක් නිවසක් විසිත්ත කාමරයකින්, පවුලේ කාමරයකින්, නිදන කාමර 03කින්, ගරාජයකින්, සඳළුතලයකින්, මුළුතැන්ගෙයකින් සහ නාන කාමර 02කින් යුක්ත වේ.







ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 117.69 කි. ව්‍යාපෘතිය 2012 අප්‍රේල් මස ආරම්භ කර ඇති අතර 2014 අප්‍රේල් මස වනවිට නිම කර ඇත.











2014 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 28 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 102 කි.

5. පාදුක්ක පොළ ඉඩමෙහි යෝජිත ඇළ මාර්ගය සහ අඩි පාලම ඉදිකිරීම

- අරමුදල් සැපයීම නාගරික සංවර්ධන අධිකාරිය විසිනි

ඉහත ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පහක් ලෙස ශ්‍රීලඉගොහාසසං වෙත ප්‍රදානය කෙරිණි. එනම්, අඩිපාර සහ ඇළ මාර්ගය ඉදිකිරීම, පාදුක්ක පොළ පරිශ්‍රයේ පවතින ඇළ මාර්ග පද්ධතිය නැවත සංවර්ධනය කිරීම (අදියර I) අදියර II, අදියර III, අදියර IV යටතේ ගේබියන් රැඳවුම් බැම් ඉදිකරන ලදී.

ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 36.82 විය. ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සැප්තැම්බර් මස ආරම්භ කර 2014 වර්ෂයේ අප්‍රේල් මස සම්පූර්ණ කර ඇත.









2014 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 11 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 33 කි.

6. හොරණ නගර සංවර්ධන ව්‍යාපෘතිය – අදියර II - *නාගරික සංවර්ධන අධිකාරිය විසින් අරමුදල් සපයන ලදී.*

හොරණ නගර සංවර්ධන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී.යෝජිත රැඳවුම් බැම්, දෙමහල් ගොඩනැගිල්ල සහ බස් නැවතුම සහ සම්බන්ධිත වියුහ ආදිය සමඟ ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 112.48 කි.

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් මස ආරම්භ කර ඇති අතර 2015 සැප්තැම්බර් මස වනවිට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

2014 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 11.9 කි.





07. කෑගල්ල යෝජිත බස් ඩිපෝව සඳහා ඉඩම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

අරමුදල් සැපයීම-නාගරික සංවර්ධන අධිකාරිය විසිනි

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. ඉඩම් ගොඩකිරීම, මීටර් 130 සහ මීටර් 280ක දිගින් යුත් යෝජිත රැඳවුම් බැම් ඉදිකිරීම,මීටර් 81.5 ක දිගින් යුත් විසම රළුගල් ඇළ මාර්ගය ඉදිකිරීම, මීටර් 80 දිගින් යුත් පැති අපවාන ඉදිකිරීම, යෝජිත මීටර් 8.5ක දිගින් යුත් හතරැස් බෝක්කුවක් ඉදිකිරීම සහ මීටර් 280ක සහ මීටර් 85ක දිගින් යුත් තාප්ප ඉදිකිරීම ඇතුලත් වන ඉහත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 98.88කි..

ව්‍යාපෘතිය 2014 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර 2015 පෙබරවාරි මස වන විට අවසන් කිරීමට නියමිතය.

2014 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මි. 8කි.







08. කළුතර යෝජිත සාප්පු සංකීර්ණය - *අරමුදල් සැපයීම නාගරික සංවර්ධන අධිකාරිය විසිනි*

කළුතර නගර සංවර්ධන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. මහජනතා සඳහා පහසුකම් සැපයීම පිණිස සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම ව්‍යාපෘති අරමුණ වේ.

ව්‍යාපෘතියෙහි දළ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 344කි. 2014 වර්ෂයේ දෙසැම්බර් මස ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කර ඇති අතර 2016 වර්ෂයේ පෙබරවාරි මස වනවිට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

2014 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද සමුච්චිත කාර්යයන්හි වටිනාකම රු.මි. 1.95කි.

09. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ බෙලිඅත්තෙහි යෝජිත නාගරික පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් බෙලිඅත්ත නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත. යාන්ත්‍රික, විදුලි සහ ජලනල කාර්යයන් ඇතුළුව සිවිමහල් වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 569.25කි.

ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර 2016 ජූලි මස වන විට අවසන් කිරීමට නියමිතය.

10. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය යටතේ පොල්වත්තෙහි ප්‍රධාන ගබඩා සඳහා මායිම් තාප්පයක්, මුර කුටියක් සහ වැටක් ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලදී. විසම රළුගල් බැම්, ගඩොල් බැම් සහ නිම කිරීමේ කාර්යයන් ඇතුළුව මායිම් බැම්මකින්, රැඳවුම් බැම්මකින් සහ මුර කුටියකින් සමන්විත වන ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.5.57කි. ව්‍යාපෘතිය 2013 වර්ෂයේ දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර 2014 වර්ෂයේ අප්‍රේල් මස අවසන් කර ඇත.


2014 වර්ෂය තුළ සිදු කරන ලද සමුච්චිත කාර්යයන්හි වටිනාකම රු.මි. 4.8කි.

11. ශ්‍රීලඉගොහාසසං සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක්, ශ්‍රීලඉගොහාසසං දකුණු පැත්තෙහි බෝක්කුව ඉදිකිරීම සහ ශ්‍රීලඉගොහාසසං පරිශ්‍රයේ භූමි සැකසුම් කාර්යයන්

ගොඩනැගිල්ල G+4+Roof වහලයකින් සමන්විත වේ. මෙම ගොඩනැගිල්ල වාහන අංගනයක්, මහල් තුනක කාර්යාල පරිශ්‍රයක් සහ ශ්‍රවණාගාරකින් සමන්විත වේ. මෙම ගොඩනැගිල්ලේ මුළු වර්ග ඵලය වර්ග අඩි 20710කි. ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 110කි. ව්‍යුහාත්මක සහ සේවා ඇඳීම් සකස් කිරීම පර්යේෂණ සහ සැපසුම් අංශය වෙත භාර කර ඇති අතර ඉදිකිරීම් කටයුත්ත් ඉදිකිරීම් අංශයට භාර දී ඇත.

2014 වර්ෂය තුළ සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 68.29ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 161.12 කි.

ව්‍යාපෘතිය 2015 ජූනි මස අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘතියෙහි අදියර II රු.මි. 90.0ක පිරිවැයකින් සිදු කරමින් පවතී.





12. කිඹුලාවල යෝජිත ව්‍යායාම් ශාලාව ඉදිකිරීම

ගොඩනැගිල්ල, ව්‍යායාම් ප්‍රදේශයකින්, පළතුරු යුෂ වෙළඳසැලකින්, විවේක කාමරයකින්, ඇඳුම් මාරුකරන කාමරයකින්, කාර්යාල පරිශ්‍රයකින් සහ සැලූනයකින් සමන්විත වේ. මුළු ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි.32.08කි. ව්‍යාපෘතිය 2014 වර්ෂයේ පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර 2014 වර්ෂයේ දෙසැම්බර් මස සම්පූර්ණ කිරීමට නියමිතය.









13. අනුරාධපුර නිවාඩු නිකේතනයක් ඉදිකිරීම (අදියර I)

අවශ්‍ය සියලු සිවිල් කාර්යයන්, ජලනල, යාන්ත්‍රික සහ විදුලි සේවා ආදිය ඇතුළුව දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස කාණ්ඩ 02කින් (C වර්ගය සහ E වර්ගය) සමන්විත වන ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 40.65කි.

ව්‍යාපෘතිය 2014 වර්ෂයේ අගෝස්තු මස ආරම්භ කරන ලද අතර 2014වර්ෂයේ දෙසැම්බර් මස සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. 2014 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 4.33කි.

14. අත්තිඩිය කාර්යාල ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කිරීමේ කාර්යයන්

ඉහත ව්‍යාපෘතිය ශ්‍රීලඉගොහාසසං විසින් සිදු කර ඇත. ඇතුලත වෙන්කිරීම්, බිම්අළු ඇතිරීමේ කාර්යයන්, ජලනල සහ අපවහන පද්ධති අළුත්වැඩියා කාර්යයන් සහ පින්තාරු කිරීමේ කාර්යයන් වලින් සමන්විත වන ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 3.23කි.





ව්‍යාපෘතිය 2014 වර්ෂයේ මාර්තු මස ආරම්භ කරන ලද අතර 2014 වර්ෂයේ අගෝස්තු මස සම්පූර්ණ කර ඇත. 2014 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 3.99කි

15. කිරිමණ්ඩල මාවතෙහි ගබඩාවක් ඉදිකිරීම

සංස්ථාව සඳහා ද්‍රව්‍යය ගබඩා කර තැබීමේ සහසුකම් සැලසීම සඳහා ගබඩා ඉදිකිරීම ආරම්භ කර ඇත. සියලු සිවිල් කාර්යයන් ඇතුළුව යකඩ තහඩු වහලින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ව්‍යාපෘතියට අයත් වේ. ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය රු.මි. 3.78 කි.

ව්‍යාපෘතිය 2014 වර්ෂයේ පෙබරවාරි මස ආරම්භ කරන ලදී. 2014 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 2.66කි





පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය

සංස්ථාවට අයත් සියළු යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රෝපකරණ වල හිමිකාරීත්වය, ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව සම්බන්ධයෙන් පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය වගකීම දරනු ලැබේ.

මෙම අංශය විසින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් වන්නේ, විශාල පිරිසැකසුම් කාර්යයන් භාරගැනීම, සේවාදායක සඳහා හැරීමේ ව්‍යාපෘති භාර ගැනීම, පිරියත සහ යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම ආදියයි.

2013 වර්ෂය තුලදී ශ්‍රීලඉගොහාසසං වේ පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය හැරීමේ සහ බර පිරිසැකසුම් කාර්යයන් බොහොමයක් සාර්ථකව නිම කර ඇත.

1. වේරැස් ගහ ව්‍යාපෘතිය යටතේ බෙල්ලන්විල වැසි ජල රැඳවුම් ජලාශය හැරීම.
2. වේරැස් ගහ ව්‍යාපෘතිය යටතේ දෙල්කඳ මංසන්ධිය අසල වැව හැරීම.
3. කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ සහ හම්බන්තොට සූරියවැව ප්‍රදේශයේ වැව් දෙකක් හැරීම
4. අනුරාධපුර කුඹිව්වන්කුලම වාරි වැව හැරීම.
5. කුරුණෑගල, තිත්තවැල්ල වැව හැරීම

2014 වර්ෂයේ අගෝස්තු මාසයේදී ලෝක බැංකුව විසින් මූල්‍යාධාර සපයනු ලැබූ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් බර ද්‍රව්‍යය ප්‍රවාහන වාහන රාශියක් සංස්ථාවට ලැබිණි. ඩම්ප් ට්‍රක් රථ (කියුබ් 3 සහ කියුබ් 5), ට්‍රැක්ටර් රථ, වතුර බවුසර සහ මගී ප්‍රවාහන වාහන කිහිපයක් මෙයට ඇතුලත් විය.

ලැබුනු යන්ත්‍රසූත්‍ර වල වටිනාකම ආසන්න වශයෙන් රු.මි. 250 කි. මෙම යන්ත්‍රසූත්‍ර භාවිතයට ගැනීමෙන් බාහිර සැපයුම්කරුවන්ගෙන් යන්ත්‍රසූත්‍ර කුලියට ලබා ගැනීම අඩු කිරීමට සංස්ථාවට හැකි විය.



MCUDP යටතේ මිලදී ගත් ප්‍රවාහන රථ



ගාලු මුවදොර පැවති භාරදීමේ උත්සවය

නව යන්ත්‍රසූත්‍ර නඩත්තු කටයුතු සඳහා නව වැඩපොළ ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. වේරැස් ගහ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර I යටතේ බෙල්ලන්විල වගුරෙහි වැව හැරීමද 2014 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.



වේරැස් ගහ ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර



බෙල්ලන්විල වැව හැරීම



වාරය එන තුරු සිටින ටිපර් රථ



බෝලවලාන වැව

බර යකඩ පිරිසැකසුම් සහ යාන්ත්‍රික කාර්යයන් සඳහා පිරියත සහ යන්ත්‍රසූත්‍ර වැඩපොළෙහි පහසුකම් ඇත. සංස්ථාව විසින් සැලසුම් කර ඉදි කරනු ලැබූ උද්‍යාන සහ අඩිපාර සඳහා සූර්ය අලෝක කණු පිරිසැකසුම් කර සැපයීමට හැකිවීම 2014 වර්ෂයේදී අංශය විසින් සාක්ෂාත් කර ගන්නා ලද සැළකිය යුතු ජයග්‍රහණයක් විය. බාහිර සේවාදායකයින්ටද සූර්ය බලශක්ති කණු සැපයීමෙන් ආදායමක් උපයාගැනීමට අපට හැකි විය .







පාවෙන වෙළඳපොළෙහි යකඩ ආරුක්කු පාලම



බෙල්ලන්විල සූර්ය බලශක්ති කණු සිටුවීම

ඉඩම් සහ අලෙවි අංශය

ගංවතුරෙන් තොර පරිසරයක කර්මාන්ත කටයුතු, වාණිජ කටයුතු සහ නිවාස සඳහා සුදුසු නව ඉඩම් සකස් කිරීම සංස්ථාවේ එක් ප්‍රධාන අරමුණකි. සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී එයට සහාය දැක්වීම සඳහා මෙම අංශයට ඔවුන්ගේම වූ අරමුණුද පවතී.

1. ඉඩම් විකිණීමෙන් හා බදු දීමෙන් ලබන ආදායම් වැඩිදියුණු කර ගැනීම

2. ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා සංවර්ධන අභිප්‍රායන් සඳහා හඳුනාගත් ඉඩම් පැවරීම

3. ප්‍රකාශයට පත් කිරීම් තුලින් බස්නාහිර පළාත තුළ සහ ඉන් පිටත පිටත ජල රැඳවුම් ඉඩම් අනවසරයෙන් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීම අවම කිරීම තුළින් ගංවතුර අවදානම අඩු කිරීම සඳහා කටයුතු කිරීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉඩම් හා අලෙවි අංශය පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

(i) සංවර්ධන කටයුතු සඳහා සුදුසු ඉඩම් අත්පත් කර ගැනීම.

(ii) මහ කොළඹ ගංවතුර පාලන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද ජල රැඳවුම් ඉඩම් කළමනාකරණය කිරීම සහ ඒවායේ භාරකරු වශයෙන් කටයුතු කිරීම.

(iii) ඉඩම් බැහැර කිරීමේදී, ඉඩම් අන් සතු කිරීමේ මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කිරීම.

(iv) 2006 අංක 35 දරණ සංශෝධිත පනත ප්‍රකාරව තෙත් ඉඩම් ප්‍රකාශයට පත් කිරීම.

(v) එවැනි සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්වන අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සහ ඔප්පු ලබා දීම.

බැහැර කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වනු ඇත.

(i) <u>දීර්ඝ කාලීන කල්බදු</u>
විශේෂයෙන් අනුමත ව්‍යාපෘති සඳහා දීර්ඝ කාලීන පදනමින් එනම් වර්ෂ 30 හෝ 50ක කාලපරිච්ඡේදයක් සඳහා ඉඩම් වෙන්කර දෙනු ලැබේ.

(ii) <u>සෘජු විකුණුම්</u>
රජයේ ආයතනයන්හි අවශ්‍යතාවය පදනම් කර ගනිමින් රාජ්‍ය ආයතන වෙත ඉඩම් විකිණීම කෙරෙහි ඉඩම් පැවරීමේ ක්‍රියාවලියේදී වැඩි අවධානයක් යොමු කෙරේ.

(iii) <u>නිවාස සඳහා සින්නක්කර ඉඩම් විකිණීම</u>
පෞද්ගලික නිවාස තැනීම සඳහා ඇති අවශ්‍යතාවය සපුරාලමින් ටෙන්ඩර් කැඳවීමෙන් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියකින් ඉඩම් විකිණීම ඉඩම් බැහැර කිරීමේ තවත් ක්‍රමවේදයකි.

(iv) <u>කෙටි කාලීන කල්බදු</u>
ඉල්ලීම් අනුව සළකා බලා කෙටි කාලීන / තාවකාලික පදනමින් ඉඩම් / ගොඩනැගිලි පවරා දීම සිදු කරනු ලැබේ.

ඉහත විකිණීම්/ බදු දීම් සිදු කරනු ලබන්නේ අපහරණ ක්‍රමවේදය අනුව අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසුවය.

නව ඉඩම් අත්පත් කර ගැනීම් :

ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම සඳහා කොළඹ නගරයේ සහ තදාසන්න නගරවල සිදු කරනු ලබන නව සංවර්ධන කාර්යයන්වලට සහාය දැක්වීම පිණිස, ආසන්න වශයෙන් අක්කර 25ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන ඉඩම් කිහිපයක් තලන්ගම, කලපලුවාව සහ අංගොඩ ප්‍රදේශවලින් අත්පත් කර ගැනීම සඳහා කටයුතු යොදා ඇත. ඊට අමතරව, පාර්ලිමේන්තු ජලාශයේ ඉහළ ජලාධාර ප්‍රදේශයේ අක්කර 70ක ප්‍රමාණයක වගුරු ඉඩමක් ජල රැඳවුමක් ලෙස අත්පත් කර ගනිමින් සිටී.

තෙත් බිම් කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා කොලොන්නාව ප්‍රදේශයෙන් අක්කර 227ක් සහ ඇළ මාර්ග සංවර්ධනය සඳහා මුතුරාජවෙළ ප්‍රදේශයෙන් මීටර් 50ක ඉඩම් තීරුවක් අත්පත් කර ගැනීම සඳහාද යෝජනා කර ඇත.

තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම :

සංශෝධිත පනතෙහි ඡේද අංක 2ආ(1) සහ 4අ(1) යටතේ සිදු කරන ලද ප්‍රකාශයට පත්කිරීම් වලට අනුව, ඉඩම් සහ අලෙවි අංශය දිවයිනෙහි තෙත්බිම් සහ ඇළ මාර්ග රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේ යෙදී සිටී.

බස්නාහිර, දකුණ,ඌව සහ මධ්‍යම පළාත්වල තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම මේ වනවිට සම්පූර්ණ කර ඇත. වයඹ, සබරගමුව සහ උතුරු මැද පළාත්වල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී. අනෙකුත් පළාත්වල අදියර වශයෙන් ප්‍රකාශයට පත් කරනු ඇත.

අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානවල පදිංචි කිරීම :

සංස්ථාව විසින් අත්පත් කරගන්නා ලද වගුරුබිම් ප්‍රදේශවල අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානවල පදිංචි කිරීම සඳහාද ඉඩම් සහ අලෙවි අංශය කටයුතු කරනු ලැබේ. එවැනි ව්‍යාපෘති අත්තිඩිය, තලකොටුවත්ත-කිරුළපන, ඔරුගොඩවත්ත, මුතුරාජවෙළ-වත්තල සහ වෙදමුල්ල-කැළණිය යන ප්‍රදේශවල සිදු කෙරේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව එවැනි පවුල් සඳහා පැවරුම් ඔප්පු ලබාදීමට කටයුතු යොදා ඇත.

විකුණුම් සහ කල්බදු :


2014 වර්ෂය තුළදි සංස්ථාව විසින් විකුණුම් / කල්බදු වලින් ආසන්න වශයෙන් රු.මි. 203ක මුල්‍ය ප්‍රවාහයක් සාක්ෂාත් කර ගෙන ඇත.මේ සඳහා ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙන් ලැබුනු රු.මි. 20ක්, ශ්‍රී ලංකා ගුවන් හමුදා ඉඩම සඳහා දෙහිවල ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබුනු රු.මි.51ක් සහ මාර්ග සංවර්ධන අධිකාරියේ උප කොන්ත්‍රාත්කරුවෙකුගෙන් ලැබුනු රු.මි. 44ක් ඇතුලත් වේ.

පසුගිය වර්ෂය හා සැසඳීමේදී විකුණුම් සහ කල්බදු වලින් මුදල් ගැලීම 30%කින් ඉහළ ගොස් ඇත. 2015 වර්ෂය සඳහා විකුණුම් සහ කල්බදු වලින් අපේක්ෂිත ආදායම රු.මි.300කි.

මානව සම්පත් සංවර්ධන අංශය

පුහුණු සහ සංවර්ධනය

සංස්ථාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම අරමුණු කරගත් සංස්ථාවේ ක්‍රිරයාකාරකම් සැලකිල්ලට ගනිමින් 2014 වර්ෂයේදී පුහුණු සහ සංවර්ධන ක්‍රිරියාකාරකම් සඳහා ප්‍ර මුඛත්වය ලබා දී ඇත. 2014 වර්ෂය සඳහා ප්‍රාතිපාදන වෙන් කි රු.මි.4කි. 2014 වර්ෂය සඳහා රැකියා කාණ්ඩය අනුව පුහුණු ප්‍ර තිපාදන වෙන් කිරීම පහත පරිදි වේ.



2014 වර්ෂයේදී නව මානව සම්පත් තොරතුරු පද්ධතියත් ක්‍රිරියාවට නංවන ලද අතර සැලසුම් කළ සහ සත්‍යද පුහුණු ක්‍රිරියාවලිය මාසිකව සැසඳීම සඳහා ඒ තුළ වෙනම තොරතුරු සමුදායක් ස්ථාපනය කරන ලදී. .

මීට අමතරව, 2014 වර්ෂයේ සිට පහත වැඩසටහන් පුහුණු සහ සංවර්ධන සැලැස්මට එක් කරන ලදී.

- සාමාන්‍ය ය පුහුණු වැඩසටහන්
- ඒකාබද්ධ සමාජ වගකීම් (CSR)
- විනෝදාත්මක සහ එළිමහන් ක්‍රිරියාකාරකම්

පහත පුහුණු ක්‍රිරියාකාරකම් 2014 වර්ෂයේදී සම්පූර්ණ කර ඇත.

අනු අංකය	විස්තරය	සහභාගීවූවන් ගණන
01.	දේශීය පුහුණු	113
02.	විදේශ පුහුණු	34
03.	ගෘහස්ථ පුහුණු	210
04.	නම්නීකරණ වැඩසටහන්	120

2014 වර්ෂයේ පුහුණු සඳහා දරන ලද සත්‍යර පිරිවැය රු. 2,142,201.00ක් වූ අතර විදේශ පුහුණු වැඩසටහන් සඳහා දරන ලද සත්‍යි පිරිවැය රු. 3,679,990.00 කි.

බඳවා ගැනීම් සහ උසස්වීම්

සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා 2013 නොවැම්බර් මස 08 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා දී ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුව සමහර කාණ්ඩ සඳහා 2013 දෙසැම්බර් මස 06 වැනි දින සහ 2014 නොවැම්බර් මස 03 වැනි දින සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සඳහා සංශෝධන සිදු කර ඇත.

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාවෙහි පවතින පුරප්පාඩු අනුව සහ සංස්ථාවේ පවතින සේවා අවශ්‍යතාවයන් අනුව සුදුසු අපේක්ෂකයින් ස්ථිර හෝ තාවකාලික පදනමින් ආකර්ණය කර ගැනීමේ, තෝරාගැනීමේ සහ පත් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය, සංස්ථාවේ බඳවාගැනීමේ ක්‍රියාවලිය ලෙස හැඳින්විය හැක.

බඳවා ගැනීමේ ක්‍රියාවලිය අභ්‍යන්තර වශයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) සහ අනෙකුත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ / හෝ බඳවා ගැනීමේ විශේෂඥයින් විසින් සිදු කරනු ලැබේ. තවද, ක්‍රියාවලියෙහි කොටසක් ලෙස රේඛීය අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශ නියෝජිතයෙකු සහභාගී වේ.

2014 වර්ෂය තුළදී බඳවාගත් තනතුරුවල සංක්ෂිප්ත විස්තරයක් පහත දක්වා ඇත.

	තත්ත්වය	තෝරාගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව	බඳවා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව	
			ස්ථිර	කොන්ත්‍රාත්
1	සිවිල් ඉංජිනේරු II ශ්‍රේණිය	17	16	1
2	පරිසර විද්‍යාඥ	1	1	-
3	සහකාර ප්‍රමාණ සමීක්ෂක	9	9	-
4	බර උපකරණ ක්‍රියාකරු	4	4	-
5	ඉංජිනේරු සහකාර	20	20	-
6	පාරිසරික නිලධාරී	1	1	-
7	සමාජ සේවා නිලධාරී	1	1	-
8	ඉංජිනේරු (භූ සම්පත් සහ කැණීම්)	2	2	-
9	පරිසර විද්‍යාඥ	2	2	-
10	කළමනාකරණ ගණකාධිකාරී	1	1	-
11	ප්‍රධාන ගණකාධිකාරී	1	1	-
12	ගණකාධිකාරී (REDECO හරහා)	1	-	01
13	ගිණුම් සහකාර	1	1	-
14	ඉඩම් සහකාර (කළමනාකරණ පුහුණුකරුවන් ලෙස බඳවාගෙන ඇත)	8	8	-
15	ගබඩා සහායක	1	1	-
16	මිනින්දොරු	1	-	01
17	ඉංජිනේරු (සැලසුම් සහ නිර්මාණ)	1	-	01
18	අභ්‍යන්තර විගණන සහකාර	2	2	-

19	කළමනාකාර සහායක -තාක්ෂණික/ තාක්ෂණික නොවන	19	19	-
20	බර වාහන රියදුරු (ලොරි/ටිපර්)	24	24	-
21	බර වාහන රියදුරු (ට්‍රැක්ටර්)	14	13	01
22	පිරිසිදු කරන්නන්/උදවුකරුවන්	18	08	10
23	ග්‍රීස් කරන්නන්	11	-	11
24	බෝට්ටු ක්‍රියාකරුවන්	03	03	-
25	කාර්ය අධීක්ෂක (සිවිල්)	07	07	-
26	කාර්ය අධීක්ෂක (යාන්ත්‍රික)	02	02	-
27	රථ වාහන කාර්මික	02	02	-
28	සැලසුම්කරු	14	14	-
29	බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු	09	06	03
30	සැහැල්ලු වාහන රියදුරු	13	13	-
31	උපස්ථායක	01	01	-
32	මැනුම් කම්කරු	06	06	-
33	ක්ෂේත්‍ර කම්කරු	04	04	-
34	කණිෂ්ඨ අධීක්ෂක	09	09	-
35	වැද්දුම්කරු	03	03	-
36	සනීපාරක්ෂක කම්කරු	02	-	02
37	ආරක්ෂක මුරකරු	01	-	01
38	පද්ධති ක්‍රියාකරු	01	01	-
	මුළු එකතුව	**237**	**206**	**31**

උසස්වීම්, යහපත් කාර්ය සාධනය සඳහා සේවකයාට ලැබෙන ත්‍යාගයක් විය හැකි අතර සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබෙන තෙක් සිටීම හේතුවෙන් සංස්ථාව තුළ මෙය ක්‍රියාවට නැංවීම වසර කිහිපයක් ප්‍රමාද විය.

බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමතිය ලැබීමෙන් පසු, 2014 වර්ෂයේ සිට අදාල තනතුරු සහ ශ්‍රේණි සඳහා සේවකයින් බඳවාගැනීම සහ උසස්කිරීම ආරම්භ කරන ලදී.

කාර්ය සාධන කළමනාකරණය

කාර්ය මණ්ඩල නියුක්තිය, සංවර්ධනය සහ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා කාර්ය සාධන කළමනාකරණ ක්‍රියාවලි සිදු කරන ලදී.

සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා ඔවුන්ගේ උපරිමයට ලගා වීමට හැකියාව ලබා දීම සඳහා පුද්ගල ඵලදායීතාවය සහ ක්‍රියාවලි ඉහළ නැංවීමෙන් වෘත්තීය වගකීම් සහ අපේක්ෂාවන් පැහැදිලි කිරීමට කාර්ය සාධන කළමනාකරණ ක්‍රියාවලිය ඉඩ ලබා දේ. පැහැදිලි අභිමතාර්ථ සහ අරමුණු සන්නිවේදනය කිරීම, ඔවුන්ගේ වෘත්තියෙහි ඵලදායීව යෙදීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව, උපකරණ සහ සම්පත් පවතින බව සහතික කර ගැනීම, අඛණ්ඩ පුහුණුව ලබාදීම සහ ප්‍රතිචාර

ලබා ගැනීම, ප්‍රගතිය සහ කාර්ය සාධනය සාරාංශ කරමින් වාර්ෂික කාර්ය සාධන සමාලෝචනයක් සකස් කිරීම සහ කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා ඔවුන්ට සහාය දැක්වීම තුළින් මෙය සාක්ෂාත් කර ගනු ලැබේ.

එහි ප්‍රතිඵලයක් ලෙස අදාල අංශ ප්‍රධානීන්ගේ නිර්දේශය සමඟ සියළුම සේවකයින්ගේ කාර්ය සාධනය, නව කාර්ය සාධන ඇගයීමේ පද්ධතියක් හඳුන්වාදීම තුළින් 2013 වර්ෂයේ සිට වාර්ෂිකව අධීක්ෂණය කර ඇත.

ශ්‍රම බලකාය

2014 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනය සේවක සංඛ්‍යා තොරතුරු පහත පරිදි වේ.

තනතුරු නාමය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව		
			ස්ථිර	අනියම්	කොන්ත්‍රාත්
සාමාන්‍යාධිකාරී	HM 2-2	01	01	-	-
අතිරේක සාමාන්‍යාධිකාරී	HM 2-1	02	01	-	01
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	HM 1-3	11	11	-	01
සහකාර සාමාන්‍යාධිකාරී	HM 1-1	14	10	-	01
කළමනාකරණ කාණ්ඩය	MM 1-1	121	92	-	06
කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩය	JM 1-1	52	44	-	-
බලාත්මක කිරීමේ නිලධාරි	MA 5-1	01	-	-	-
සහකාර නිලධාරි කාණ්ඩය	MA 3	53	45	-	-
කළමනාකාර සහකාර- තාක්ෂණික කාණ්ඩය	MA 2-2	141	133	-	-
කළමනාකර සහකාර- තාක්ෂණික නොවන කාණ්ඩය	MA 1-2	210	186	-	-
ප්‍රාථමික මට්ටම් කාණ්ඩය - පුහුණු	PL 3	313	331	-	06
ප්‍රාථමික මට්ටම් කාණ්ඩය - අර්ධ පුහුණු	PL 2	103	101	-	-
ප්‍රාථමික මට්ටම් කාණ්ඩය - නුපුහුණු	PL 1	504	479	02	26
	මුළු එකතුව	**1526**	**1434**	**02**	**41**

සැපයුම් අංශය

කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීම, ඵලදායී සැලසුම්කරණ, බලය බෙදාහැරීම, පිරිවැය අඩු කිරීම ආදිය තුලින් සැපයුම් අංශය පිරිවැය අවස්ථාවක සිට ලාභ උපයන අවස්ථාව දක්වා පරිවර්තන අවදියක පසු වේ.
2013 වර්ෂය හා සැසඳීමේදී 2014 වර්ෂයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

අයිතමය	**2013 (ගණන)**	**2014 (ගණන)**
ගැනුම් අධියාචන	2808	3446
මුද්‍රා තැබූ ටෙන්ඩර	598	798
මිලට ගත් බඩු	75	73
ප්‍රසම්පාදන කමිටු ලිපිලේඛන	965	2046
ප්‍රසම්පාදන වටිනාකම	මිලියන 4500	මිලියන 4500

ප්‍රසම්පාදන සංඛ්‍යාව 1081කින් ඉහළ ගියද 2013 සහ 2014 වර්ෂවලදී ප්‍රසම්පාදන පිරිවැය එකම මට්ටමකින් (මිලියන 4500) පවත්වා ගැනීමට අංශය සමත් වී ඇත. මෙය ප්‍රධාන වශයෙන් සිදු කරන ලද්දේ ඵලදායී සහ කාර්යක්ෂම ටෙන්ඩර් පටිපාටි යොදා ගැනීමෙන්, ඉදිකිරීම් ද්‍රව්‍යය, පෙර මිශ්‍ර කොන්ක්‍රීට්, යන්ත්‍ර සූත්‍ර කුලියට ගැනීම ආදිය සඳහා වාර්ෂික මිල ගණන් පවත්වා ගැනීමෙන් සහ සාධාරණ ප්‍රසම්පාදන පද්ධතියකට අනුගත වීමෙන් සහ සැපයුම්කරු පරාසය පුළුල් කිරීමෙනි.

නව ජයග්‍රහණ:

1. ව්‍යාපාර සංවර්ධන රැස්වීම්වලදී එළඹී වැදගත් තීරණ
   - නව මධ්‍යම ගබඩා සංකීර්ණය
   - කිඹුලාවල ව්‍යායාම් ශාලාව

2. කාර්යක්ෂමතාවය, සඵලතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කර ගනිමින් සැපයුම් අංශය පරිවර්තනය වෙමින් සිටී

නීති අංශය

1968 අංක 15 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (ශ්‍රීලඉගොහාසසං) පනත හා එහි සංශෝධනයන් මගින් පවරා ඇති බලතල ප්‍රකාරව නීති අංශය ක්‍රියාත්මක වේ.

නීතිමය කාර්යයන්:

1. ඉඩම් අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම, පදිංචි කිරීම හා සිය කැමැත්තෙන් නොවන නැවත පදිංචි කිරීම.

2. ඉඩම් සංවර්ධනය කිරීම් සහ නැවත පදිංචි කිරීම් සඳහා අදාළ නීති කෙටුම්පත් ලියවිලි සකස් කිරීම, අඩු ආදායම්ලාභී පවුල් පදිංචි ප්‍රදේශවල ජනතාව සඳහා ප්‍රජා උපදේශන හා නීතිමය ආධාර සැපයීම.

3. සංස්ථාව මගින් හා සංස්ථාවට විරුද්ධ නඩු හබ ආදියේදී අධිකරණයේදී සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම හා ආරක්ෂා කිරීම.

4. සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

5. සියලු ආකාරයේ අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව, ජල අපවහන සැලසුම්වල සඳහන් කොන්දේසි කඩ කරන්නන්ට එරෙහිව, ඇළ මාර්ග රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් සහ 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත හා එහි සංශෝධනයන් මගින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි පිහිටි ඇළ මාර්ග දූෂණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සංස්ථාව බලාත්මක වී ඇත.

6. සියලු අවබෝධතා ගිවිසුම් සැකසීම හා සහතික කිරීම, අළෙවි ගිවිසුම්, කොන්ත්‍රාත්/ උපදේශන ගිවිසුම්, දිගු කාලීන බදු දීම්, වාර්ෂික බදු දීම්, කෙටි කාලීන බදු දීම්, ඔප්පු පවරා දීම්, අදාළ නීතිමය ලියකියවිලි, විදේශ රැකියා පොරොන්දු පත්‍ර (වැටුප් සහිත/ රහිත), මෝටර් රථ ණය ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර සහ ඉඩම් නිරවුල් සහතික පත් සඳහා ඉඩම් හිමිකම් වාර්තාවන්හි අයිතිය.

7. සංශෝධන සහිත වර්තමාන පනත ප්‍රමාණවත් නොමැති බව පෙනී ගොස් ඇති බැවින් වර්තමාන පනත නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත සංශෝධනය කිරීම අවශ්‍යයෙන් කළ යුතුව ඇත. සංශෝධන සඳහා වන යෝජනාවලට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇත. අමාත්‍ය මණ්ඩල අනුමතිය අනුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රීලඉගොහාසසං පනත් කෙටුම්පත සකස් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2014 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වාර්තාව හා සංස්ථාවේ ගිණුම් සතුටින් ඉදිරිපත් කරයි.

මූලික කාර්යයන්

සංස්ථාවේ මූලික කාර්යයන් මෙහෙයුම් සමාලෝචනයේ (පිටු අංක 6 සිට 85) සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි (105 වන පිටුව) විස්තර කර ඇත.

වර්ෂය පිළිබඳ මෙහෙයුම් සමාලෝචනය

වර්ෂය තුළ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමාලෝචනයක් මේ යටතේ දක්වා ඇත.

පිරිවැටුම

2013 වර්ෂයේ පිරිවැටුම වූ රුපියල් මිලියන 2,503 (භාණ්ඩාගාරයෙන් ප්‍රදානය කරන ලද රු.මි.1,025) (ප්‍රතිප්‍රකාශිත)ට සාපේක්ෂව 2014 වර්ෂයේ පිරිවැටුම රුපියල් මිලියන 3,243කි (භාණ්ඩාගාරයෙන් ප්‍රදානය කරන ලද රු.මි.1,608) .

ලාභය

සංස්ථාවේ 2013 වර්ෂයේ ලාභය වන රුපියල් මිලියන 178 (ප්‍රතිප්‍රකාශිත) හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ බදු පෙර ලාභය රුපියල් මිලියන 432කි. පසුගිය වර්ෂයේදී බදු හා අයකිරීම්වලට පසු ලාභය වන රුපියල් මිලියන 152 හා සැසඳීමේදී 2014 වර්ෂයේ බදු පසු ලාභය රුපියල් මිලියන 347කි.

කටයුතුවල තත්ත්වය

සංස්ථාවේ කටයුතුවල තත්ත්වය මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි වේ.

දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ පිළබඳ සිදු වූ සංසරණය ගිණුම් හා සම්බන්ධ සටහන් 9 හි දක්වා ඇත.

බදු ගෙවීම

ආදායම් බදු

2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත සහ එකී සංශෝධන ප්‍රකාර බදු ගෙවීම් සඳහා කරන ගැළපුම් අනුව වර්ෂයේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

විලම්භීත බදු

බැරකම් ක්‍රමය මත විලම්භීත බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විලම්භීත බදුකරණ ගිණුමේ ශේෂය මඟින්;

i) ක්ෂය දීමනා අයකරගනු ලබන වත්කම්වල බදුකරණ අභිමතාර්ථය සඳහා ලියාහල අගය සහ එවැනි වත්කම්වල ශුද්ධ පොත් අගයෙහි වෙනස සඳහා අදාල කරගත හැකි ආදායම් බදු

ii) විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් මඟින් පැනනඟින කාල වෙනස සඳහා අදාල කරගත හැකි ආදායම් බදු නියෝජනය වේ.

<u>අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව (ඉදිරියට..)</u>

කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 19 හි අනාවරණය කර ඇති පරිදි හැර සංස්ථාවේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සංස්ථාව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශ්වාසය පළ කර සිටී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

ඔවුන්ගේ දැනුවත් වීම සහ විශ්වාසය අනුව රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සිදු කළ සියළු විමධ්‍යගත ගෙවීම් නියමිත කලට වේලාවට සිදු කළ බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

සේවක මණ්ඩලය

2014 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පුද්ගලයින් 1,477 දෙනෙකු සංස්ථාවේ සේවයේ නියුතුව ඇත.

ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසු සිදු වී ඇති වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්වල ගැළපීම් සිදු කර ඇත.

අති විශේෂිත අයිතමයන්

වෙනම වාර්තා කළ යුතු අසාමාන්‍ය/ අති විශේෂිත ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් මගින් වාර්තා කර ඇත.

විගණකවරු

2014 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලබනවා ඇත.

මණ්ඩලයේ අණ පරිදි

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙනුවට

ලේකම් 2015/05/12

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } ඩී/ර්-2/ඊ/එස්එල්එල්ආර්සීඑස්/1/14/22 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2016 ජනවාරි දින.

සභාපති,
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 15 දරන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන මණ්ඩල පනතේ 17 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ඇත.

1.2 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය පදනම් කරගත් ලේඛන සම්බන්ධයෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ලෝක සීමාසහිත ලේඛාධිකාරී විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුගත ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආයතන ආචාරධර්ම අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය - සමුහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

තත්ත්වාගණනය කළ මතය - සංස්ථාව

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමුහය

සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන, සංස්ථාවේ පරිපාලිතය වූ සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගමේ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර තිබුණි. පරිපාලිත සමාගම සම්බන්ධයෙන් සංස්ථාවේ භූමිකාරිත්වය පරිපාලිත සමාගමේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 80 ක් නියෝජනය විය.

2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සංස්ථාව

2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරුවන් සංස්ථාව

(i) ප්‍රමිතිය ප්‍රකාශය [illegible] අනුව [illegible] මෙම ආදායම් හා වියදම් සහ වත්කම් හා වගකීම් එකිනෙකට හිලව්කිරීමක් සිදු කොරගෙන යුතු නමුත් එයට පටහැනිව එකතුව රු.29,218,308 ක් වූ [illegible] ජංගම නොවන වගකීම්වලට හිලව් කර ගිණුම්ගත කර තිබුණු [illegible] ජංගම වත්කම් යටතේ දැක්විය යුතු සමුහයට අදාළ අයකරගත යුතු ආදායම් බදු රු.5,123,000 ක් ජංගම වගකීම්වලට හිලව් කර දක්වා තිබුණි. එසේම රු.6,894,452 ක වටිනාකම ගැලපීම් අලාභයක්, වෙනත් මෙහෙයුම් ආදායමට හිලව් කර තිබුණි.

(ii) අධිකාරියට අදාලව පෙර වර්ෂයේ අගයන් දැක්වීමේදී සෙමින් වලනය වන තොග සඳහා ප්‍රතිපාදනය ලෙස රු.49,344,000 ක් දක්වා තිබුණද, සමුහයට අදාලව මෙම වටිනාකම් දක්වා නොතිබුණි.

(iii) සමුහයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්විය යුතු රු.2,070,000 ක ගෙවිය යුතු ලාභාංශ, වෙළඳ හා වෙනත් ගෙවීම් යටතේ දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් විවිධ උත්සව සඳහා දරන ලද වියදම්වලින් රු. 1,632,552 ක් වේරැස්ගහ ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධනිත කර තිබූ අතර රු.634,233 ක් දියත උයන පරිශ්‍රයේ වියදම් වශයෙන් දක්වා තිබුණි.

(v) 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව පැවති රු.63,057,537 ක් වූ ශේෂය තුළ පළාත් පාලන ආයතනයකට සහ පෞද්ගලික සමාගමක් වෙත පිළිවෙලින් ගෙවිය යුතුව පැවති රු.1,050,000 ක සහ රු.862,545 ක ඍණ ශේෂයන් ද ඇතුලත් වී තිබුණි.

(vi) ඉදිරි වර්ෂයේදී නිරවුල් විය යුතුව පවතින රජයේ ප්‍රදාන රු.695,327,000 ක් සහ කල්බදු අත්තිකාරම් රු.351,115,058 ක වගකීම් මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ වෙනම පෙන්වා නොතිබුණි.

(vii) ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු රු.773,276,000 ක් වූ නිම කරන ලද ව්‍යාපෘති වටිනාකම, වෙළඳ තොග යටතේ දක්වා තිබුණි. එම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

පිරිවැය රු.1,879,594,100 [illegible] 1,269,563 ක වැලි තොගයෙහි 2014 දෙසැම්බර් 31 දිනට ශුද්ධ උපලැබිය හැකි අගය ගණනය කර පිටුවැය සමඟ සසඳා එහි අවම අගය මුල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇත. [illegible] වැලි තොගයෙහි අගය පිරිවැය මත දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

(i) පූර්ව වර්ෂයේ සමුච්චිත ලාභයට පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීමක් ලෙස ගලපා තිබූ පිළිවෙලින් රු.151,525,000 ක් හා රු.194,093,000 ක් වූ විලම්භිත ආදායම් ගැලපීම සහ සමුච්චිත ක්ෂය වෙන් කිරීම්, මූදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුල්‍ය නොවන අයිතම යටතේ ගලපා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් අයිතමයන් 04 ක ශේෂ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් ශේෂ සමඟ සැසඳීමේදී රු.404,245 ක වෙනසක් විය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ගැලපිය යුතු රු.48,486,882 ක් වූ ප්‍රතිපාදන ගැලපීම්, පෙර වර්ෂයේ ගැලපීම් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයට ගලපා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 11

සංස්ථාවට හා සමූහයට අදාලව පිළිවෙලින් රු.1,752,564,028 ක් හා රු.1,887,222,000 ක් වූ ඉදිකිරීම් නොනිමි වැඩ සම්බන්ධයෙන් ආදායම් හඳුනාගැනීම හා කොන්ත්‍රාත්තුවේ නිමවුම් ප්‍රතිශතය පිළිබඳව හෙලිදරව් කිරීම් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12

සංස්ථාවට අදාල පිළිවෙලින් වූ රු.38,231,000 ක හා රු. 46,967,000 ක ආදායම් බදු හා විලම්භිත බදු ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රමිතියේ 80(ඇ), 80(ඉ), 81(ඇ), සහ 81(උ) වූ යන වගන්ති අනුව ප්‍රමාණවත් හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

ප්‍රමිතියට අනුව ස්ථාවර වත්කම් ආවේණික ගාස්තුයට යුදුසු තත්ත්වයට පත්වූ දින සිට ක්ෂය කළ යුතු වුවද සංස්ථාව විසින් වත්කම් මිලදී ගත් දිනය ඇතුලත් කාර්තුවේ සිට ඉදිරියට ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් මස මිලදීගත් රු.17,000,000 ක් වටිනා වාහන වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19

සංස්ථාවට හා සමුහයට අදාලව පිලිවෙලින් රු.242,126,233 ක් හා රු.255,253,000 ක් වූ සේවක ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධව ප්‍රමිතියට අනුව ප්‍රමාණවත් හෙලිදරව් කිරීම් කර නොතිබුණි. තවද සේවක ප්‍රතිලාභ ගෙවීම් අරමුදල්වල අයුගනක වටිනාකම තක්සේරු කිරීමට පාදක කරගත් උපකල්පනයන් මුල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20

සංස්ථාව වෙත ලැබී තිබුණු රු.695,326,546 ක් වූ රාජ්‍ය ප්‍රදාන ලබාදීමේ කොන්දේසි හා අසම්භාව්‍යයන් පිළිබඳව මුල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් පරිදි හෙලිදරව් කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40

(i) සංස්ථාවට හා සමුහයට අදාලව මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.501,354,118 ක් වූ ආයෝජිත දේපල සම්බන්ධව ප්‍රමිතියේ නියමයන්ට අනුව හෙලිදරව් කිරීම් කර නොතිබුණි.

(ii) සංස්ථාව කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබුණු ඉඩම්, සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශයන්හි ආයෝජිත දේපල යටතේ දක්වා නොතිබූ අතර එම ඉඩම්වල වටිනාකම පිළිබඳ තොරතුරුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂයේ කැණීම් ආදායමෙන් හා වියදමෙන් පිළිවෙලින් රු.36,141,295 ක් හා රු.36,864,124 ක් අඩුකර මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ කැණීම් ආදායම හා වියදම ඉහත වටිනාකම්වලින් අඩුවෙන් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සංස්ථාව මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා යෙ:
වෙළඳ වටිනාකම, මුහුදු වැලි විකිණීමේ ආදායම ලෙස ගිණුම්ගත නොකර වැලි විකිණීමේ ශුද්ධ ලාභය වූ රු.5,310,473 ක් මුහුදු වැලි විකුණුම් වටිනාකම යටතේ දක්වා තිබුණි.

2.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කල තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ විලම්භිත බදු වගකීම රු.6,453,851 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.13,426,308 ක වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු බදු වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද රු.4,651,159 ක් වුවත් ගෙවිය යුතු ආදායම් බදු ගිණුමේ එම ශේෂය රු.16,933,452 ක වගකීමක් ලෙස දක්වා තිබුණි.

(ඇ) දියත උයන දුම්රිය ආපනශාලා ව්‍යාපෘතියට අදාල පිරිවැය ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්ගත කර තිබුණු මුදල රු.48,086,038 ක් වුවද සංස්ථාවේ කැණීම් සහ ගොඩකිරීම් අංශයේ තොරතුරු වලට අනුව එහි පිරිවැය රු.52,776,991 ක් විය.

2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 562,851,630 ක ණයගැති ශේෂය තුළ වර්ෂ 2ත් 5ත් අතර කාලයක සිට හිඟ හිටි ණයගැති ශේෂය රු.35,752,231 ක් වූ අතර වර්ෂ 5 ට වැඩි හිඟ හිටි ශේෂය රු.17,650,119 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් සංස්ථාව වෙත ලැබී තිබුණු ඉඩම් විකුණුම් අත්තිකාරම් මුදල රු.531,415,470 ක් විය. ඉන් රු.489,066,062 ක් වූ අත්තිකාරම් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. තවද වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක සිට නිරවුල් නොකළ අත්තිකාරම් ප්‍රමාණය රු.20,215,565 ක් විය.

(ඇ) වර්ෂ ගණන්දෙසැම්බර් 31 දිනට අවසන් වූ වගකීම් යටතේ අයත් මුහුරාජවෙල ඉඩමෙන් ඉවත්කර ගන්නා ලද වැලි නැවත පිරවීමට සහ එම ඉඩම පරිහරණය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු පිළිවෙලින් රු.180,271,866 ක් හා රු.186,995,861 ක් යමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විදේශීය සමාගමක් වෙත 2014 ජනවාරි 01 දිනට ගෙවිය යුතු මුදල වූ රු.මිලියන 84.7ක් වර්ෂය අවසානය වන විටත් පියවා නොතිබුණු අතර විනිමය අනුපාත වෙනස්වීම හේතුවෙන් මෙම වගකීම 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 91.6 ක් දක්වා වර්ධනය වී තිබුණි.

2.5 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩල පනතේ 2(ආ) 1 වගන්තිය	බස්නාහිර, දකුණු, මධ්‍යම හා ඌව පලාත හැර වෙනත් පලාත්වල පහත් බිම් වගුරු මුඩු හෝ ගොහොරු ප්‍රදේශ නිශ්චය කර ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 8 ඒ වගන්තිය	අදාළ පළාත් පාලන ආයතනය වෙතින් ලබා ගත යුතු අනුමැතිය ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකර තිබුණි. මෙම නිසා ඉදිරි වර්ෂ වලදී අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් රු.12,041,540 ක පමණ බැරකමක් උද්ගතව තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 395	සංස්ථාව විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙක සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම බැංකු ගිණුම් වල පැවති ශේෂය රු. 26,080,588 ක් විය.

(i) 8.3.8 වගන්තිය

2003 ජූනි 02 දිනැති අංක පිටිඩ/1.2 දරන ශ්‍රී ලංකා ව්‍යාපාර වක්‍රලේඛය

(i) සංස්ථාවේ කාර්ය මණ්ඩලයට අමතරව සංස්ථාවේ කාර්යයන්ට සහාය වූ ශ්‍රී ලංකා යුධ හමුදා, නාවික හමුදා, සිවිල් ආරක්ෂක බලකා සහ පොලිසියේ විධායක නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී එක් අයකුට රු.43,500 බැගින් රු. 2,293,100 ක් වටිනා තෑගෑ වවුචර් ලබාදී තිබුණි.

(ii) තවද කාර්ය මණ්ඩලයට රු.30,000 බැගින් වාර්ෂික දිරි දීමනාවක් ගෙවීම සඳහා රු.40,306,064 ක් වැයකර තිබුණි.

ඉහත (i) හා (ii) අවස්ථාවලදී මහාභාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර දිරි දීමනා ගණනය සඳහා විධිමත් ක්‍රියාවලියක් ද භාණ්ඩාගාරයෙන් අනුමතකර ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ හා සංස්ථාවේ බදුපෙර ලාභය පිළිවෙලින් රු.මිලියන 452.7 ක් හා රු.මිලියන 431.8 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය පිළිවෙලින් රු.මිලියන 201.3 ක් හා රු.මිලියන 178.6 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා සංස්ථාවේ බදුපෙර ලාභයෙහි පිළිවෙලින් රු.මිලියන 251.4 ක හා රු.මිලියන 253.2 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමූහයේ හා සංස්ථාවේ මෙහෙයුම් නොවන ආදායම පිළිවෙලින් රු.මිලියන 415.7 කින් හා රු.මිලියන 415.8 කින් වැඩිවී තිබීම ශුද්ධ ලාභයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

1.2 ප්‍රගුහාත්මක මුල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ පරිපාලන වියදම් රු.මිලියන 643.9 ක් දක්වා සියයට 50 කින් ඉහළ ගොස් තිබුණු අතර සංස්ථාවේ අරමුණු සඳහා සෘජුව අදාළ නොවන කාර්යයන් වෙනුවෙන් දරනලද රු.මිලියන 15.1 ක් සහ පොදු වියදම් රු.මිලියන 22.5 ක් දක්වා සියයට 40 කින් වැඩිවී තිබීම මෙම වියදම් වැඩිවීමට සෘජුව බලපා තිබුණි.

(ආ) වෙරැස්ගහ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රාජ්‍ය බැංකුවකින් රු.මිලියන 1,200 ක ණය මුදලක් ලබාගැනීම හේතුවෙන් සංස්ථාවේ ණය ප්‍රාග්ධන අනුපාතය සියයට 18 සිට සියයට 63 දක්වා වැඩිවී තිබුණි. තවද මෙම ණය මුදලින් රු.මිලියන 452.7 ක් අදාල කාර්යයට යොදා නොගෙන කෙටිකාලීන ආයෝජන වල යොදවා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කල සංස්ථාවේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එනම් වසර 07 ක කාලයක් ගතවූ පසුද නිමකර නොතිබුණු අතර එම ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය සියයට 60 ක් විය. එසේම කොන්ත්‍රාත්තුව නිම කිරීමට අදාල කාලරාමුවක් සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට පෙර සිට ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු.මිලියන 378.84 ක් වැයකර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය තුලදී අත්හැර දමා තිබුණි. මේ සඳහා වැයකර ඇති මුදල නිශ්ඵල වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් 54.89 ක් වූ ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණු ව්‍යාපෘති 23 ක් සඳහා රු.මිලියන 162.56 ක් සැලසුම්ගතකිරීමක් නොමැතිව වැයකර තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ඉටුකළ යුතු කාර්යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් රු.මිලියන 592.79 බැගින් වූ අර්ධ වාර්ෂික වාරික 24 කින් පියවිය යුතු රු.මිලියන 14,227 ක ණය මුදලක් රාජ්‍ය බැංකුවකින් ලබාගැනීමට ගිවිසුමකට එළඹ තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 1,600 ක් ලබාගෙන ඉන් රු.මිලියන793.7 ක් සංස්ථාවේ අරමුණු වලට පටහැනි කාර්යයන් වෙනුවෙන් වැයකර තිබුණි. මෙයින් රු.මිලියන 62.11 ක් වීරකැටිය ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් ආරම්භකර නිටපු දේශපාලඥයෙකුගේ අනුස්මරණ කෞතුකාගාරයක් සහිත ස්මාරකයක් ඉදිකිරීම සඳහාද රු.මිලියන 594.8 ක් බොරලැස්ගමුව උතුර නිමින භූමිය සංවර්ධන ව්‍යාපෘතිය සඳහාද රු.මිලියන 21.7 ක් බෝලවලාන 16 වන පාප් බෙනඩික් ආසියානික සංස්කෘතික මධ්‍යස්ථානයේ යෝජිත පොකුණ සංවර්ධනය කිරීම සඳහාද වැයකර තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි ගෙවීම කඩිනම් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් වාර්ෂිකව සියයට 7 ක පොළියක් සමඟ වන්දි නිරවුල් කිරීමට සංස්ථාවට සිදුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ ගෙවිය යුතු වූ වන්දි සහ පොළී වටිනාකම රු.මිලියන 229.46 ක් විය.

4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දියත උයන ආහාරපාන අලෙවි අංගනයේ පරිහරණය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව රු.මිලියන 2.58 ක් වැයකර එළවලු තැටි 100 ක් මිලට ගෙන තිබුණි. මෙම භාණ්ඩ සැපයීම නියමිත දිනට වඩා මාස හතරකට වැඩිකාලයක්

ප්‍රමාද කර සපයා තිබුණු අතර සංසන්දනාත්මක පරීක්ෂණයේ දී නොවැම්බර් 15 දින දක්වා විගණන වාර්තාවට නොගෙන සංස්ථාවේ ගබඩාවක නිෂ්කාර්යව තිබුණි.

(ආ) සංස්ථාවේ විෂයපථයට අදාළ නොවන කාර්යයක් සඳහා එනම් අනුරාධපුර හා පොලොන්නරු ප්‍රදේශ සඳහා ගංවතුර ආධාර සැපයීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 12.4 ක් වටිනා වියලි ආහාර ද්‍රව්‍ය මිලදීගෙන තිබුණි. එසේ වුවත් එම ද්‍රව්‍ය බදුල්ල ප්‍රදේශයට ප්‍රවාහනය කර බෙදාදී තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) අනුරාධපුර කුබිච්චන්කුලම වැව ප්‍රතිසංස්කරණය යටතේ ගංවතුර පාලනය සඳහා ලැබූ අරමුදලින් රු.මිලියන 297.71 ක් එම අරමුණට පටහැනිව වැයකර වැවේ සීප්ලේන් හැසිරවිය හැකි පරිදි සකස් කර ඒ ආශ්‍රිත නගර අලංකරණ කටයුතු සඳහා රු.මිලියන 94.32ක් ද වැයකර තිබුණි.

(ඈ) සංස්ථාව විසින් මුහුදු වැලි ගොඩදමා අලෙවි කරනු ලබන අතර එම ක්‍රියාවලියට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 1992 අංක 33 දරන පතල් හා බණිජ ද්‍රව්‍ය පනතට පටහැනිව 2013 වර්ෂයේ සිට වැලි ප්‍රවාහනය සඳහා සංස්ථාව විසින් සකස්කළ බලපත්‍රයක්, වැලි මිලදී ගන්නන්ට වැලි ප්‍රවාහනය සඳහා ලබාදී තිබුණි. මෙම තත්ත්වය මත රජයට අයවීමට තිබුණු බණිජ ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර ගාස්තු වර්ෂ 02 තුල අහිමි කිරීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ii) තවද 1993 නොවැම්බර් 26 දිනැති අංක 794/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව අත්කර ගන්නා සියලු බණිජ ද්‍රව්‍ය ප්‍රමාණය මත රාජ්‍ය භාගයක් ගෙවිය යුතු වුවද 2008 වර්ෂයේ සිට සංස්ථාව විසින් ගොඩදැමූ මීටර් කියුබ් 4,478,679 ක මුහුදු වැලි සඳහා නියමිත පරිදි රාජ්‍යභාග ගෙවීමට කටයුතු කර නොතිබුණි. 2013 හා 2014 වර්ෂවලට අදාල රාජ්‍ය භාග හා ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 44.7ක් ගෙවන ලෙස භූවිද්‍යා කැණීම් හා පතල් කාර්යාංශය සංස්ථාවෙන් ඉල්ලීමක්ද කර තිබුණි. මෙම තත්ත්වය නොසලකා සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළ විකුණන ලද මුහුදු වැලි ප්‍රමාණය මත පමණක් රාජ්‍යභාගය ලෙස රු.මිලියන 6.9 ක ප්‍රතිපාදන මුල්‍ය ප්‍රකාශනවල සලසා තිබුණි.

(iii) යටෝක්ත කරුණු අනුව 1993 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන උල්ලංඝනයෙන් කර ඇති බැවින් නියමිත දිනට අදාල රාජ්‍ය භාගය නොගෙවීම හේතුවෙන් සංස්ථාවට රු.මිලියන 13 ක් ප්‍රමාද ගාස්තු ගෙවීමට නියමිතව තිබුණි.

(ඉ) වේරැස්ගහ ව්‍යාපෘතිය ඊට පෙර නොනිමී පැවැ වශයෙන් දක්වා තිබූ රු.104,995,322 ක් තුළ සමාලෝචිත වර්ෂ අවසාන ශේෂය සඳහා දරන ලද රු.1,623,552 ක් ඇතුලත් වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුල සංස්ථාවේ රාජ්‍ය බැංකුවක ගිණුමකින් ගෙවිය යුතු ලෙස දක්වා තිබුණ රු.16,376,156 ක් වටිනා චෙක්පත් 08 ක් හිමිකරුවන් වෙත භාරනොදී 2015 මාර්තු මාසයේදී අවලංගු කර තිබුණි. එය අවලංගු කිරීමට හේතු වූ කරුණු අනාවරණය ද නොකෙරුණි.

4.4 වෙනත් ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව සංස්ථාව සතු සම්පත් රේඛීය අමාත්‍යාංශයේ හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබාදීමට අවසර නොමැති වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ කාර්ය මණ්ඩලයෙන් 05 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන වෙත් මුදා හැර තිබූ අතර එම අයගේ වැටුප් හා දීමනා ලෙස සංස්ථාව විසින් රු.මිලියන 4 ක් වැයකර තිබුණි.

4.5 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,671 ක් වූ අතර එදිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 1,475 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 196 ක් විය.

(ආ) තවද අනුමත නොකළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල්) තනතුරට ස්ථිර පදනමින් නිලධාරියකු බඳවා ගෙන රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ අතර කොන්ත්‍රාත් පදනමින් බඳවාගත යුතු රියදුරන් 50 ක් ස්ථිර පදනමින් ද බඳවාගෙන තිබුණි.

4.6 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරුණු දැක්වේ.

(අ) සංස්ථාවේ සභාපතිවරයාගේ භාවිතය සඳහා මිලදීගෙන තිබූ රු.6,150,000 ක් වූ වාහනයක් එම අවශ්‍යතාවයෙන් බැහැරව මිලදීගත් දින සිටම කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත පුදාහැර තිබුණි.

(ආ) වර්ෂ 10 කට පෙර මිලදීගත් කැබරථ දෙකක යාන්ත්‍රිකමය නොවන අළුත්වැඩියාවන් සඳහා රු.මිලියන 2.2 ක් වැයකර තිබීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම.

ඉඩමේ අයිතිය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව විසින් දුම්රිය මැදිරි ස්ථාවර ලෙස පොළවට සම්බන්ධ කර දියත උයන පරිශ්‍රයේ ආපන ශාලා සංකීර්ණයක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. මෙම කාර්යය 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

4.8 හඳුනාගන්නා ලද පාඩු

සංස්ථාවේ උප සමාගමක් වෙත ලබාදී තිබූ රු.මිලියන 2.5 ක ණය මුදල සමාලෝචිත වර්ෂය තුල පොත් වලින් ලියා හැර තිබුණි.

4.9 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංසරණය නොවන තොග ශේෂය රු.867,000 ක් ද සෙමින් චලනය වන තොග ශේෂය රු.මිලියන 124.3 ක් ද විය. මේ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සෙමින් චලනය වන තොගයේ වටිනාකම සියයට 94 කින් වර්ධනය වී තිබුණි.

4.10 ආර්ථික නොවන ගණුදෙනු

සංස්ථාව විසින් වෙරස්ගහ ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබුණු ඇවිදින මංතීරු හා ආහාරපාන අංගනය විවෘත කිරීමේ උත්සවය සඳහා ආහාරපාන සැපයීම හා සංගීත ප්‍රසංග වෙනුවෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් හා අවශ්‍යතාවයකින් තොරව රු.මිලියන 33.78 ක වියදමක් දරා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

ගැසට් නිවේදන ප්‍රසිද්ධ කිරීම මගින් දිවයින පුරා පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සංස්ථාව වෙත පවරා තිබුණද එම කාර්යයන් සංස්ථාවේ 2013-2017 කාලපරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ හා සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

කළමනාකරණය විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මහ පෙන්වීම් සඳහා වැදගත් ක්‍රියාවලියක් ලෙස අභ්‍යන්තර විගණනය යොදා ගත යුතුය. කෙසේ වුවත් මහා පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ලෙස සංස්ථාවේ කාර්යයන් පුළුල් වීමත් සමඟ අර්ථාන්විත ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය බලගැන්වීම සඳහා සංස්ථාව විසින් නිසි අවධානයක් යොමු කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සංස්ථාවේ මූල්‍ය හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව පාලනය කිරීමට හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම යටතේ හඳුනාගත් කටයුතු පිළිබඳ ප්‍රගතිය 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය වක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොවිසඳී පැවතුණි.

(අ) අදාළ වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය වෙත අබණ්ඩව වෘත්තීය දීමනා ගෙවීම.

(ආ) නිලධාරීන්ගෙන් වාහන ණය මත අයකරනු ලබන පොලිය අබණ්ඩව නැවත ප්‍රතිපූර්ණය කර තිබීම.

(ඇ) සංස්ථාව විසින් රු.මිලියන 30.2 ක පිරිවැයක් දරා සංවර්ධනය කරන ලද අක්කර 3.5 ක් වූ ඉඩමක, ප්‍රාදේශීය ලේකම්ගේ සහයෝගය මත කෝවිලක් ඉදිකළ පාර්ශ්වයකට එරෙහිව නීතිමය පියවර කඩිනමින් ගන්නා ලෙස 2012 නොවැම්බර් 30 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණි. කෙසේ වෙතත් , අදාළ නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර අදාල කෝවිල විසින් පරිහරණය කරනු ලබන භූමි ප්‍රමාණය අක්කර 02 පර්චස් 11 ක් ලෙසටත් එහි වටිනාකම රු. මිලියන 18.5 ක් ලෙසටත් මේ වන විට හඳුනාගෙන ඇති බව සභාපතිවරයා පවසා ඇත.

5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම.

දිවයින පුරා සිදුකරනු ලබන අනවසර ඉඩම් ගොඩකිරීම් මඟින් බොහෝ පාරිසරික හා සමාජීය ගැටළු නිර්මාණය කර තිබුණු අතර ඒවා අනාගත පරම්පරාවන් වෙතද බලපාන බැවින් ජනතාව දැනුවත් කිරීමට සහ එවැනි අනවසර ඉඩම් ගොඩකිරීම් වැළැක්වීමට සංස්ථාවට පැවරී ඇති බලතල යොදා ගෙන නොතිබුණි. කෙසේ වෙතත් සංස්ථාවේ පනත තුලින් ප්‍රමාණවත් බලතල ලැබී නොමැති හෙයින් ගැටළු පවතින බවත් පනත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතින බවත් සභාපතිවරයා පවසා ඇත.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත යඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය
(ආ) ව්‍යාපෘති කටයුතු මූල්‍යකරණය
(ඇ) බදු කළමනාකරණය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) ගිණුම්කරණය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2014.01.01 සිට 2014.12.31 දින දක්වා වූ වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා

		සමූහය		සංස්ථාව	
	සටහන	**2014**	2013 ප්‍රතිප්‍රකාශිත	**2014**	2013 ප්‍රතිප්‍රකාශිත
		රු.000	රු..000	**රු.000**	රු.000
ආදායම	1	**2,029,029**	1,723,800	**1,622,780**	1,478,028
විකුණුම් පිරිවැය	2	**(1,588,882)**	(1,370,764)	**(1,230,822)**	(1,166,777)
දළ ලාභය		**440,147**	353,036	**391,958**	311,251
ලැබුනු භාණ්ඩාගාර අරමුදල්		**1,608,821**	1,024,999	**1,608,821**	1,024,999
වෙනත් ප්‍රදාන		**11,336**	-	**11,336**	-
දරන ලද පිරිවැය		**(1,620,157)**	(1,024,999)	**(1,620,157)**	(1,024,999)
		-	-	**-**	-
වෙනත් මෙහෙයුම් ආදායම්	3	**112,572**	121,097	**109,436**	114,513
පරිපාලන වියදම්	4	**(672,284)**	(455,490)	**(643,924)**	(430,058)
වෙනත් මෙහෙයුම් වියදම්	5	**(299,647)**	(202,072)	**(296,703)**	(200,569)
		(971,931)	(657,562)	**(940,627)**	(630,627)
භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා මාරු කරනු ලැබූ පොදු කාර්ය පිරිවැය		**271,656**	200,396	**271,656**	200,396
		(700,275)	(457,166)	**(668,971)**	(430,231)
මෙහෙයුම් වලින් ලත් ලාභ/(අලාභ)		**(147,556)**	16.967	**(167,577)**	(4,467)
මූල්‍ය පිරිවැය	6	**(14,137)**	(14,397)	**(13,206)**	(13,754)
මෙහෙයුම් නොවන ආදායම්	7	**614,422**	198,726	**612,666**	196,867
බදු සහ අයකිරීම් පෙර ලාභය/(අලාභ)		**452,729**	201,296	**431,883**	178,646
බදුකරණය සඳහා ප්‍රතිපාදන	8	**(85,948)**	(28,761)	**(85,198)**	(26,261)
වර්ෂය සඳහා බදු පසු ලාභය/(අලාභය)		**366,781**	172,535	**346,685**	152,385
ආරෝපණය කල ලාභය:					
මව් සමාගමේ සමකොටස් හිමිකරුවන්		***355,778***	166,875		
පාලනය නොකරන පොළිය		***11,003***	5,660		

වරහන් තුල ඇති අගයන් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.

පිටු අංක 110 සිට 114 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 115 සිට 130 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා

		සමූහය		සංස්ථාව	
	සටහන්	**2014** රු.000	2013 ප්‍රතිප්‍රකාශිත රු.000	**2014** රු.000	2013 ප්‍රතිප්‍රකාශිත රු.000
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල, පිරියත සහ උපකරණ	9	**1,090,786**	707,014	**1,086,421**	704,214
දේපල ආයෝජන	18	**501,354**	501,354	**501,354**	501,354
අනුබද්ධිත ආයතන වල ආයෝජන	10	-	-	**2,000**	2,000
වෙනත් ආයෝජන	11	**25,486**	18,514	**-**	-
		1,617,626	1,226,882	**1,589,775**	1,207,568
ජංගම වත්කම්					
ඉන්වෙන්ටරි	12	**4,972,174**	3,666,823	**4,816,008**	3,589,282
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	13	**1,041,479**	707,697	**919,261**	616,265
තැන්පතු හා පූර්ව ගෙවීම්		**16,658**	13,069	**15,698**	10,484
ගෙවන ලද යෙදවීමේ අත්තිකාරම්		**-**	-	**-**	-
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්		**46,247**	41,381	**46,247**	41,381
මුදල් හා මුදල්වලට සමාන දේ	14	**1,010,596**	882,083	**992,748**	863,613
මුළු ජංගම වත්කම්		**7,087,154**	5,311,053	**6,789,962**	5,121,025
මුළු වත්කම්		**8,704,780**	6,537,935	**8,379,737**	6,328,593
හිමිකම් හා බැරකම්					
ප්‍රාග්ධනය හා සංචිත					
දායක ප්‍රාග්ධනය		**1,000**	1,000	**1,000**	1,000
ප්‍රත්‍යාගණන සංචිත		**-**	-		-
වත්කම් ප්‍රතිස්ථාපන සංචිත		**1,472**	1,472	**-**	-
ප්‍රාග්ධන සංචිත		**13,461**	13,461	**13,461**	13,461
ආදායම් සංචිත		**2,545,445**	2,147,153	**2,529,545**	2,140,346
පාලනය නොකරන පොළිය		**15,632**	4,629	**-**	-
මුළු ප්‍රාග්ධන සංචිත		**2,577,010**	2,167,715	**2,544,006**	2,154,807
ජංගම නොවන බැරකම්					
ඉඩම් සඳහා වන්දි		**229,465**	227,112	**229,465**	227,112
වෙනත් ජංගම නොවන බැරකම්	15	**1,050,692**	776,964	**1,046,492**	772,764
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		**255,253**	222,374	**242,126**	209,469
දීර්ඝ කාලීන ණයගැනීම්		**1,200**	1,200	**-**	-
විලම්භීත බදුකරණය		**(15,792)**	(75,180)	**(13,426)**	(60,393)
මුළු ජංගම නොවන බැරකම්		**1,520,818**	1,152,470	**1,504,657**	1,148,952
ජංගම බැරකම්					
GOSL-විශේෂ ව්‍යාපෘති බැරකම්	16	**2,102,525**	1,146,384	**2,102,525**	1,146,384
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	17	**2,449,960**	2,042,546	**2,200,912**	1,872,674
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල්		**34,917**	35,571	**16,584**	26,713
බදු ගෙවීම්		**(5,123)**	(22,131)	**11,053**	(22,131)
බැංකු අයිරා	14	**24,673**	15,380	**-**	1,194
මුළු ජංගම බැරකම්		**4,606,952**	3,217,750	**4,331,074**	3,024,834
මුළු සම කොටස් සහ බැරකම්		**8,704,780**	6,537,935	**8,379,737**	6,328,593

අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සහ වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.
පිටු අංක 110 සිට 114 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 115 සිට 130 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

සභාපති සාමාන්‍යාධිකාරී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
2014.01.01 සිට 2014.12.31 දින දක්වා වූ වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා

මව් සමාගමේ හිමිකම් දරන්නන්ට ආරෝපණය කලහැකි

සමූහය

	දායක ප්‍රාග්ධනය රු.000	ප්‍රාග්ධන සංචිත රු.000	වත්කම් ප්‍රතිස්ථාපනය කිරීමේ සංචිත රු.000	ආදායම් සංචිත රු.000	පාලනය නොකරන පොළිය රු.000	එකතුව රු.000
***2013.01.01** දිනට ශේෂය*	1,000	13,461	1,472	1,979,247	-	1,995,180
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	-	119,980	4,069	124,049
පරිපාලිත සමාගම් අලාභ අන්තර්ග්‍රහණ ශේෂය				1,031	(1,031)	-
***2013.12.31** දිනට ශේෂය*	1,000	13,461	1,472	2,100,258	3,038	2,119,229
2013 ප්‍රතිප්‍රකාශිත						
2013.01.01 දිනට ශේෂය	1,000	13,461	1,472	1,979,247	-	1,995,180
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	-	166,875	5,660	172,535
පරිපාලිත සමාගම් අලාභ අන්තර්ග්‍රහණ ශේෂය				1,031	(1,031)	-
***2013.12.31** දිනට ශේෂය*	1,000	13,461	1,472	2,147,153	4,629	2,167,715
***2014.01.01** දිනට ශේෂය*	1,000	13,461	1,472	2,147,153	4,629	2,167,715
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	-	355,778	11,003	366,781
දේපල පරියන සහ උපකරණ ප්‍රතිඇගයීම						
සමුච්චිත ක්ෂය ගැලපීම				194,039		194,039
විලම්භීත ආදායම ගැලපීම				(151,525)		(151,525)
***2014.12.31** දිනට ශේෂය*	**1,000**	**13,461**	**1,472**	**2,545,445**	**15,632**	**2,577,010**

වරහන් තුල ඇති අගයන් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.
පිටු අංක 110 සිට 114 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 115 සිට 130 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
2014.01.01 සිට 2014.12.31 දින දක්වා වූ වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා

සංස්ථාව

	දායක ප්‍රාග්ධනය රු.000	ප්‍රාග්ධන සංචිත රු.000	ආදායම් සංචිත රු.000	එකතුව රු.000
2013.01.01 දිනට ශේෂය - විගණනය කල	1,000	13,461	1,987,961	2,002,422
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	103,899	103,899
2013.12.31 දිනට ශේෂය	1,000	13,461	2,091,860	2,106,321
2013.01.01 දිනට ශේෂය - විගණනය කල	1,000	13,461	1,987,961	2,002,422
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	152,385	152,385
2013.12.31 දිනට ශේෂය	1,000	13,461	2,140,346	2,154,807
2014.01.01 දිනට ශේෂය -ප්‍රතිප්‍රකාශිත	1,000	13,461	2,140,346	2,154,807
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	346,685	346,685
දේපල පරියත සහ උපකරණ ප්‍රතිඇගයීම				
- සමුච්චිත ක්ෂය ගැලපීම			194,039	194,039
- විලම්භීත ආදායම ගැලපීම			(151,525)	(151,525)
2014.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**2,529,545**	**2,544,006**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

2014 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමූහය		සංස්ථාව	
	2014	2013	**2014**	2013
	රු.000	රු.000	**රු.000**	රු.000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්(යෙදවූ) මූල්‍ය ප්‍රවාහය				
බදු සහ වෙනත් ගැලපීම්වලට පෙර ශුද්ධ ලාභය	460,094	140,945	439,248	118,295
ගැලපීම්				
ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන	92,534	80,745	91,139	79,916
අවිනිශ්චිත ණයගැතියන් සඳහා ප්‍රතිපාදන	7,503	(11,775)	8,218	(11,775)
බොල් ණය කපාහැරීම්	1,110	-	(716)	-
පොළී ආදායම	(70,383)	(96,436)	(68,627)	(94,579)
ස්ථාවර වත්කම් සහ අළුත්වැඩියා කල නොහැකි භාණ්ඩ විකිණීමෙන් ලත් ලාභ	(6,320)	(2,440)	(6,320)	(2,440)
සෙමෙන් සංසරණය වන ඉන්වෙන්ට්‍රි සඳහා ප්‍රතිපාදන	3,331	3,686	3,331	3,686
විකුණූ ඉඩම් වන්දි සඳහා ප්‍රතිපාදන	847	2,369	847	2,369
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය	24	24	24	24
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම සඳහා ප්‍රතිපාදන	48,237	(53,260)	46,662	(57,629)
දේපල පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රතිඇගයීම්				
- සමුච්චිත ක්‍රමක්ෂය ගැලපීම	(194,039)	-	(194,039)	-
- විලම්භීත ආදායම් ගැලපීම	151,525	-	151,525	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	494,463	63,858	471,292	37,867
ප්‍රාග්ධන වෙනස්වීම්				
ඉන්වෙන්ට්‍රි (වැඩිවීම) / අඩුවීම	88,085	(819,211)	85,253	(650,812)
ස්වකීය ව්‍යාපෘති සංවර්ධනය-WIP (වැඩිවීම) / අඩුවීම	(125,987)	(73,141)	(125,986)	(73,141)
සේවා ලාභීන්ගේ ව්‍යාපෘති සංවර්ධනය-WIP (වැඩිවීම) / අඩුවීම	(1,267,620)	7,489	(1,187,242)	(137,464)
වැඩ නිමකල ව්‍යාපෘති (වැඩිවීම)/ අඩුවීම	42,143	8,778	42,142	8,778
තැන්පතු සහ පූර්ව ගෙවීම් - (වැඩිවීම) / අඩුවීම	(3,244)	(4,094)	(5,213)	(2,287)
සේවයේ යෙදවීම වෙනුවෙන් ගෙවූ අත්තිකාරම් - (වැඩිවීම) / අඩුවීම	(159,053)	51,621	(159,052)	(25,884)
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් - (වැඩිවීම) / අඩුවීම	(182,413)	(107,960)	(151,445)	(53,587)
සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	(4,866)	(8,323)	(4,865)	4,156
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	(7,673)	(726)	(10,129)	(11,219)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	1,374,109	623,090	1,295,861	643,912
මෙහෙයුම් වලින් ලත් /(යෙදවූ) මුදල්	247,944	(258,619)	250,616	(259,681)
ගෙවූ පාරිතෝෂික	(15,328)	(7,258)	(14,004)	(6,507)
ගෙවූ ආදායම් බදු	(5,002)	(37,827)	(4,680)	(37,658)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් /(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	227,614	(303,704)	231,932	(303,846)
ආයෝජන කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහය				
දේපල පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම	(171,650)	(77,267)	(168,690)	(76,627)
විලම්භීත බැරකම්වල ආයෝජන	(6,972)	785,615	-	793,045
ලැබූ පොළී ආදායම්	66,684	96,436	63,544	78,598
ස්ථාවර වත්කම් සහ අළුත්වැඩියා කල නොහැකි භාණ්ඩ විකිණීමෙන් ලත් ලාභ	6,401	2,502	6,401	2,502
ආයෝජන ක්‍රියාකාරකම් වලින් /(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(105,537)	807,286	(98,745)	797,518
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් /(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය				
ගෙවූ පොළිය සහ වන්දි	(2,858)	(28,252)	(2,858)	(28,251)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් /(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(2,858)	(28,252)	(2,858)	(28,251)
මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම / (අඩුවීම)	119,219	475,330	130,329	465,421
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	866,704	391,374	862,419	396,999
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	985,923	866,704	992,748	862,420
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය කිරීම				
බැංකුවේ ඇති මුදල් - වාසිදායක	1,010,596	882,084	992,748	863,614
